CRI
中国国际广播电台
CHINA RADIO INTERNATIONAL

# සුභාසර

蓮花 沈鹏

තෙවන කාණ්ඩය - පළමුවන කලාපය




චීනය හා ශ්‍රී ලංකාව අතර ආර්ථික උපක්‍රම ඒකාග්‍රතාවක් පිටුව 2

නිල් හා සුදු පිඟන් භාණ්ඩ පිටුව 13

නූතන කෘෂිකර්මාන්තයට යොමුවන ප්‍රාග්ධන වෙළඳ පොළ අවධානය පිටුව 21

ලෝකයේ ලාබාලම පියානෝ විශාරදයා පිටුව 28

බඩ අඩු කළ හැකි පානයක් පිටුව 33

中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

# සුභාසර 蓮花


**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2373/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ෂාඕ ජී යං

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෙං ලී, ලියු හුයි, ෂාඕ ජී යං,
හාඕ ලී ෆාං, වං යිං, හැන් ජ්යැන්,
සුන් ජ්යා ජ්යා, බූ යුන්, චෙන් ගුවැන් වන්;
චන්දන තිලකරත්න, රවිමල් හඳුවල

**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


## පටුන


චීනය හා ශ්‍රී ලංකාව අතර ආර්ථික උපක්‍රම එකඟතාවක් 2

සේද මාවත ආර්ථික තීරය සහ 21 වැනි සියවසේ මුහුදු සේද මාවත 6

චීන කවිය 8

චීන කෙටි කථාව 9

බෙයිජිං සිරිසර - බෙයිජිං පිළිස්සූ තාරාවා 10

බෙයිජිං ඔපෙරාව 11

නිල් හා සුදු පිඟන් භාණ්ඩ 13

වඳුරාගේ වසරට උදා වූ නව වාණිජ අවස්ථා 16

චීන සැන් චියඃාං යුඅන් නව ජෛව පරිසරයකින් පොහොසත් කලාපය 18

නූතන කෘෂිකර්මාන්තයට යොමුවන ප්‍රාග්ධන වෙළඳ පොළ අවධානය 21

ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය 24

ලෝකයේ ලාබාලම පියානෝ විශාරදයා 28

එදිනෙදා චීන බස 30

චීන බිත්තර රොටි 32

බඩ අඩු කළ හැකි පානයක් 33

අසන්නන්ගේ බිත්ති පුවරුව 34

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් 36






# චීනය හා ශ්‍රී ලංකාව අතර ආර්ථික උපක්‍රම එකඟතාවක්

චීන අග්‍රාමාත්‍ය ලී ක ච්‍යාං මහතාගේ ආරාධනාවකට අනුව, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අප්‍රේල් මස 6 වනදා සිට 9වනදා දක්වා චීන නිළ සංචාරයක නිරත විය. වික්‍රමසිංහ අගමැතිතුමා බෙයිජිංහිදී චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය සමඟ විශේෂ සමුඛ සාකච්ඡාවකට එක් විය.

**ගරු අගමැතිතුමනි, මුලින්ම මා ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි මෙවර චීන සංචාරයේ බලාපොරොත්තුව කුමක් ද? දැනට චීනය හා ශ්‍රී ලංකාව දෙරටේ පොදුවේ සැලකිල්ලකට ලක් කරුණු සම්බන්ධයෙන් එකඟතාවට එළඹීමට පුළුවන් වුණා ද?**

ඔව්, අපිට චීන ආණ්ඩුව එක්ක එකඟතාව සම්පූර්ණ කර ගන්න පුළුවන් වුණා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගිය අවුරුද්දේ පැමිණි-මෙන් පසුයි ඒ මූලික සාකච්ඡා ආරම්භ කළේ. අපි මහ මැතිවරණයෙන් පසුව ජාතික ආණ්ඩුව ඇති කරලා, අපේ ආර්ථික ප්‍රතිපත්ති සකස් කළා. චීනයට ඇවිල්ලා අපි මෙතෙන සාකච්ඡා කළේ ඉදිරි දශක දෙක තුළ චීනයයි ලංකාවයි අතර ආර්ථික උපක්‍රම ගැන මූලික එකඟතාවකට පැමිණෙන්න. ඒ වැඩ කටයුත්ත අපි කළා.

**මම ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි තම රටේ සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකා රජයේ සැලැස්ම කුමක් ද කියලා?**






චීනය වගේම අපි දැනට ඉන්නේ, විශේෂයෙන් ම ආර්ථික ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උවමනා පියවර ගැනීමට. මා හිතන්නේ විටින් විට ආර්ථික ව්‍යුහය වෙනස් කරන්න තිබෙනවා. ඒ ප්‍රතිසංවිධාන චීනයෙත් ආරම්භ කළා ඔබේ ෂී ජනාධිපතිතුමා. අපිත් දැන් ඒක ආරම්භ කරලා තිබෙනවා. එතන බලන්නේ ගෝලීය ආර්ථිකය සමඟ සම්බන්ධය තවත් වැඩි කරගන්න. ඒක චීනයත් ලංකාවත් බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රතිසංවිධාන තවදුරටත් තහවුරු කරන්න, තවත් ගැඹුරු කරන්න, අපේ ආර්ථිකය වෙනස් කරන්න. චීනයයි ලංකාවයි දෙකම ඒක කර ගෙන යනවා. අන්න ඒ නිසා ඒ අවස්ථාවේදී අපිට මේවා සිදු කරන්න වෙන්නේ ගෝලීය ආර්ථිකය දියුණු යුගයක නෙවෙයි. ඇත්ත වශයෙන් ම යම් කිසි පසුබෑමක් තිබිලා අපි බලාපොරොත්තු වූ තරමට දියුණුවක් වෙලා නෑ. ඉතිං මේ අවස්ථාවේදී අපේ රටවල් දෙකම එක මාර්ගයක ඉන්නේ. අපි බලන්නේ විශේෂ-යන් ම ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යස්ථානය බවට පත් කරන්න. ඔබ බලන්නේ One Belt One

Road ප්‍රතිපත්තිය යටතේ එකට එකතු වෙන්න. අතීතයේත් මේක සිදු වුණා. වර්තමානයේත් ඒක කරන්න අපි බලා පොරොත්තු වෙනවා.

**ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව තියෙනවා. මේ ක්ෂේත්‍රයේ චීනය හා ශ්‍රී ලංකාව දෙරට කවරාකාරයේ සහයෝගතා පැවැත්වීමට අපේක්ෂා කරනවා ද?**

ඇත්ත වශයෙන් ම යටිතල පහසුකම් වගේම අපේ ආර්ථික ව්‍යුහය ප්‍රතිසංවිධාන කිරීමට අවශ්‍යයි. චීනයට ඒක ක්‍රමානුකූලව කරන්න පුළුවන් වුණා. අපිට යුද්ධය නිසා ගිය දශකය තුළ 2004න් පසු ඒ පියවර එකක්වත් ගන්න අපිට බැරි වුණා. ඒ නිසා අපේ ආර්ථික ව්‍යුහ ප්‍රතිසංවිධානයත් සමඟම ඒකට උවමනා ආර්ථික යටිතල පහසුකම් ලබා ගැනීමත්, මේ දෙකම කරන්න සිදු වෙනවා. මෛත්‍රීපාල සිරි-සේන ජනාධිපතිතුමා යටතේ අපි ඒ දෙකම එකට එකතු කරගත්තා. යටිතල පහසුකම් නැත්නම් ආර්ථික ව්‍යුහය ප්‍රතිසංවිධානය ඉදිරියට ගෙන යන්න බෑ. අනික් අතට යටිතල පහසුකම් තිබීම පමණින් අපි දියුණු වෙන්නෙත් නෑ. අද අපි කරල තියෙන ජාතික ආණ්ඩුව යටතේ මේ දෙක එකතු කරලා. ඒ එක්කම චීනයේ One Belt One Road වැඩසටහන අනුව කටයුතු කරන්නත්. ඒ වගේ ම සිංගප්පූරුව එක්ව වැඩ කටයුතු කරන්නත්, ඉන්දියාවේ Made In India හෙවත් ඉන්දිය නිෂ්පා දන, ඒ අදහස් සියල්ලම එකතු කර ගෙන ලංකාව ඉන්දියන් සාගරයේ මැද ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් කරන්නත්, යුරෝපීය සංගමයේ වෙළඳ පොළට ඇතුළ් වෙන්නත් අපි අවස්ථාව ලබා ගන්නවා.

**ඔබතුමා කිව්වා වගේ ම යටිතල පහසුකම් හා ආර්ථික පැත්තේ සහයෝගතාව හැර චීනය හා ශ්‍රී ලංකාව අතර පැවැත්විය හැකි වෙනත් සහයෝගතා මොනවා ද?**

අපි සංස්කෘතික, අධ්‍යාපන ඒ හැම අංශයක් ගැනම සාකච්ජා කරලා තියෙනවා. අපිට අවශ්‍ය වුණේ ඊළඟ දශක දෙක තුළදී අපේ ආර්ථික සම්බන්ධය ගැන සාකච්ඡා කරන්න. මොකද මෙතන එක අතකින් විශාල වෙනසක් ඇති වෙලා තියෙනවා. මෙතෙක් කල් ආණ්ඩුවේ ආයතන, අමාත්‍යංශ, දෙපර්තමේන්තු අතර මේ ආර්ථික සම්බන්ධකම් තිබුණේ. අපි තීරණය කළා දැන් ඉඳං ඒ කෙ පෙ-රමුණට එන්න ඕනේ ව්‍යාපාර කියලා. චීනයේ පැත්තෙන් රජයට අයත් ව්‍යාපාර, පළාත් වලට අයිති ව්‍යාපාර, පුද්ගලික ව්‍යාපාර අපේ පැත්තෙන් විදේශ ආයෝජන තිබෙන ව්‍යාපාරත්, ලංකාවේ ලාංකිකයන්ට අයත් ව්‍යාපාරත්.

**මා ඔබතුමාගෙන් විශේෂයෙන් ම දැන ගන්න කැමතියි විදේශ ආයෝජන මුදල් ආකර්ෂණය**











**සඳහා ශ්‍රී ලංකා රජය මොනවා ද සැලසුම් කරලා තිබෙන්නේ ?**

අපි දැනට ආයෝජකයන්ට ලංකාවට පැමිණෙන්නත් ඒවා ආරක්ෂා කරන්නත් පියවර අරන් තියෙනවා. අපේ අලුත් ආයෝජන ප්‍රතිපත්ති නීති මේ අවුරුද්ද මැදදී ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා.

**ඔබ කිව්වා වගේ විශේෂයෙන් ම ප්‍රතිපත්තිමය හා නීතිමය වශයෙන් ලබා දෙන අනුබලය පැහැදිලිව සඳහන් කළොත් ?**

අපි බලන්නේ ආයෝජන ව්‍යාපෘති අනුමත කිරීමට එකම ස්ථානයක් ඇති කරන්න. ඕනෑම ආයෝජකයෙකුට නීතිය යටතේ ඒ වගේ ම පාරිසරික වශයෙන් ලබා ගත යුතු දේ කුමක් ද කියලා සඳහන් කරන්න. මෙතෙක් එය සිදු වෙලා නෑ. එක ආයතනයකින් අනුමත කළාම සමහර විට මුළු ආණ්ඩුව දන්නේ නෑ. මේ ප්‍රධාන ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ පිළිගැනීම ඇති කරනවා. සාකච්ඡා වේවී, විවේචන ඒවි, ඒකට කමක් නෑ. අන්තිමට ඒක අවසන් කළාම ඒ ආර-ක්ෂාව සම්පූර්ණයෙන් ම ලබලා දෙනවා.

ඉදිරිපත් කිරීම : ශී යුයැ





# සේද මාවත ආර්ථික තීරය සහ 21 වැනි සියවසේ මුහුදු සේද මාවත

වසර 2000කට පෙර ආසියානු හා යුරෝපා මහා ද්වීපයන්හි ගවේෂනශීලී ජනතාව ආසියාව, යුරෝ පය සහ අප්‍රිකාව ඇතුළු



මහා ශිෂ්ටාචාර කිහිපයක් සම්බන්ධ වන වෙළෙඳ හා පුද්ගල හුවමාරු මාර්ගයක සලකුණු සනිටුහන් කළහ. එය සේද මාවත ලෙසටයි ප්‍රකට වී ඇත්තේ. ගෙවී ගිය වසර දහස් ගණන තුළ සාමකාමී සහයෝගිතා, විවෘත ඉවසීම්, අන්‍යෝන්‍ය යහපත සහ පොදු ජයග්‍රහණය යන සේද මාවත චින්තනය පරම්පරාවෙන් පරම්පරාවට පැතිර යමින් මානව ශිෂ්ටාචාරයේ ඉදිරි පැතිකඩ නිර්මාණය කළේ ය. සේද මාවත නැගෙනහිර සහ බටහිර ලෝකය අතර සහයෝගිතා පැවැත්වීමේ සංකේතයක්, ඒ පමණක් නොමෙයි, ලෝකයේ පොදු ඓතිහාසික සංස්කෘතික උරුමයකි.

21වැනි සියවසට ප්‍රවේශ වී සාමය, සංවර්ධනය, සහයෝගිතාව, පොදු ජයග්‍රහණය අගය කරන නව යුගය උදා වී තිබේ. ගෝලීය දුර්වල ආර්ථිකයේ පුනරුත්ථාපනය මෙන්ම සංකීර්ණ ජාත්‍යන්තර හා කලාපීය තත්ත්වයට මුහුණ දෙමින් සේද මාවත චින්තනයට නව ජීවයක් ලබා දීමේ වැදගත්කම කැපී පෙනේ.

2013 වසරේ චීන ජනාධිපති ෂී චින් පිං මහතා මැද පෙරදිග හා අග්නිදිග ආසියාවේ සංචාරයක නිරත වූ අවස්ථාවේදී එක තීරයක් එක මාවතක් පොදුවේ









ගොඩනැගීමේ යෝජනාව ඉදිරිපත් කළේ ය. සේද මාවත ආර්ථික තීරය සහ 21 වැනි සියවසේ මුහුදු සේද මාවත මූලාරම්භය යන මෙම යෝජනාවට ජගත් ප්‍රජාවේ ඉහළ අවධානය ලක්ව තිබේ. එක තීරයක් එක මාවතක් සංවර්ධනය පුළුල් කිරීම ඊට අදාළ සියලු රටවල් වලට පොදු ජයග්‍රහණ ගෙන දෙයි. චීනය එම යෝජනාවේ අපේක්ෂාව පමණ-ක් ඉදිරිපත් කරයි. මේ යෝජනාව හරහා සියලු රටවලට ප්‍රතිලාභයන් ලැබේවා යැයි අපි ප්‍රාර්ථනා කරමු. ශ්‍රී ලංකාව ඉතිහාසයේ සිට ම මුහුදු සේද මාවතේ වැදගත් මධ්‍යස්ථානයක් ලෙසට ප්‍රසිද්ධයි. 21 වැනි සියවසේ මුහුදු සේද මාවත යන පොදු සහයෝගිතා රාමුව යටතේ ශ්‍රී ලංකාවට යහපත් සංවර්ධන අවස්ථා උදා වනු ඇති බවට කිසිම සැකයක් නැහැ.



ඉදිරිපත් කිරීම : ශී යුයැ



# 游子吟

孟郊

慈 母 手 中 线，
游 子 身 上 衣。
临 行 密 密 缝，
意 恐 迟 迟 归。
谁 言 寸 草 心，
报 得 三 春 晖。

සෙනෙහසින් පිරි මෑණියන්
අතැඟිලි මෙහෙයවා වේගයෙන් මසයි;
අකීකරු පුත්‍රයාගේ
ඉරුණු කමිසය
පමා වේ දෝ_ඔහුට මෙවරත්
බියෙන් සැලෙයි ඇගේ දෑත්
අඟලක් තරම් වූ තනපතක්.
තමන්ට දිරිය දුන්
හිරුඑළිය පිරි වසන්තයේ මාස තුනට
තුති පිදු වේ ද කවදා හෝ.



සැම අවුරුද්දකම මැයි මාසයේ දෙවැනි ඉරිදා දිනය මව්වරුන්ගේ දිනය ලෙස ලොව පුරා සැමරෙනවා. ඒ මව්වරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය නිසා. හැම කෙනෙක්ම මවකගෙන් අසීමිත මාතෘ ආදරයක් භුක්ති විඳ තියෙනවා. සිය මවට පෙරළා ආදරය දැක්වීමයි යහපත් දරුවන්ගේ අපේක්ෂාව. ඒත් සමහර විට මවට නිසි ලෙස ආදරය දක්වන්නට අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එය කොපමණ දුකක් ද? මේ එවැනි දුක්මුසු හැඟීමක් විස්තර කෙරෙන කවියක්.

මේ කවියේ නිර්මාතෘ ටාං රාජපෙළපතේ මෙං චියාඕ නමැති කවියා. ඔහුගේ තරුණ කාලයේදී වසර විස්සකට වැඩි කාලයක් පුරා රාජ විභාගවලට සහභාගි වීමට ද රාජකාරී වැඩට ද ඉතා කාර්ය බහුල ජීවිතයක් ගත කළා. නිරන්තරව ඔහුට සිය මවගෙන් සමු ගෙන පිට ප්‍රදේශවලට යන්නට සිදු වුණා. එවැනි සෑම අවස්ථාවකදීම සිය මවට ආපසු ආදරය දක්වන්න නොහැකි වීමේ කණගාටුව මං චියාං තුළ ඇති වුණා. ඒ ශෝකී හැඟීම ඇතිව ඔහු මේ කවිය නිර්මාණය කර තිබෙනවා.



ඉදිරිපත් කිරීම : ලියු හුයි සහ චන්දන තිලකරත්න








# 熟能生巧

ඉදිරිපත් කිරීම : ලියු හුයි



පැරණි කාලයේ චෙන් කාං සූ නම් කෙනෙක් හිටියා. ඔහු ධනුද්ධරයෙක්. ඒ කියන්නේ දුනු ශිල්පයට ඉතාමත්ම දක්ෂ කෙනෙක්. තමන්ගේ ඒ නිපුණතාව ගැන ඔහු හොඳටම ආඩම්බරයි. අහංකාරයි. 'මගේ දුනු ශිල්පය මෙලොවේ ඉහලමයි. කෙනෙකුට මාව පරද්දන්න බෑ.' කියා ඔහු නිතරම අන් අයට කියනවා.

චෙන් කාං සූට ගෝලයන් ඉන්නවා. ඔවුන්ට ගුරුවරයාගෙන් ඒ මුළු ශිල්පයම ඉගෙන ගන්න හිතුවා. ඒ නිසා ඔවුනුත් නිතරම ගුරුවරයව පමණට වඩා වර්ණනා කරනවා. 'ගුරුතුමනි, ඔබ වගේ දක්ෂයෙක් තවත් මේ ලෝකයේ නැහැ. අපි ඔබගෙන් තව හුඟක් ඉගෙන ගන්න කැමතියි. ඔබ කොච්චර ශ්‍රේෂ්ඨ ද.' කියා ඔවුන් හැමදාම කියනවා.

වතාවක් මේ ගුරු ගෝල පිරිස මිදුලේ දුනු ශිල්පය පුහුණු වෙමින් සිටියා. තෙල් විකුණන මහල්ලෙක් අහම්බෙන් මෙය දැක නැවතිලා බලා සිටියා.

චෙන් කාං සූ ඊතල 10ක් දුන්නෙන් නොකඩවාම විද්දා. ඒ සැම එකක්ම ඉලක්ක පුවරුවේ මැදටම වැදුණා. ගෝලයන් අත්පොලසන් දුන්නා. චෙන් කාං සූ අහංකාරකමින් මහල්ලාගෙන් මෙහෙම ඇහුවා. 'ඔබට මොනව ද හිතෙන්නේ?' මහල්ලා සිය හිස වැනුවා පමණයි. කිසිම වචනයක් කතා කළේ නෑ.

චෙන් කාං සූට කේන්ති ගියා. ඔහු අශිෂ්ට ව මෙහෙම ඇහුවා. 'නුඹ වගේ මහල්ලන්ටත් ඊතල විදින්න පුළුවන් ද?'

'බෑ.'

'එහෙනම් මම ඊතල විද්දා හොඳ නැද්ද?'

'හොඳයි කියලා කියන්න පුළුවන් වුණාට එය සාමාන්‍ය ශිල්පයක් පමණක්. ඔච්චර පෙන්නන්න දෙයක් නෙවෙයි.' ගුරුවරයාගේ ගෝලයන්ට හොඳටම තරහ ගියා.

'මහල්ලෝ. ඔබ දන්නේ නැද්ද අපේ ගුරුතුමාගේ දුනු ශිල්පය පරද්දන්න කෙනෙක් නෑ කියලා. නුඹ මේ කළේ අපේ ගුරුතුමාට අපහාසයක්'

'ළමයිනේ. තරහ වෙන්න එපා. මා කිව්වේ ඇත්ත. ඔබලාගේ ගුරුතුමාගේ දුනු ශිල්පයේ කිසිම විශේෂයක් නෑ.'

'මහල්ලෝ. අනං මනං කියන්න එපා. ඔබට මොන ශිල්පයක්වත් තියෙනවා ද? එහෙම තියෙනවා නං අපිට පෙන්නන්න.'

'ඊතල විදින්න මට බෑ. මම මේ වැඩේ පෙන්නන්නං.'



මහල්ලා ලබු කැටයක් බිම තබා එම ලබු කැටයේ කට මත, ඇතුළේ කුඩා සිදුරක් තියෙන තඹ කාසියක් තිබ්බා. ඉන් පසුව ඔහු ලොකු හැන්දක් අර ගෙන එය තෙල්වලින් පුරවා, ඉඳ ගෙනම ලබු කැටයට තෙල් වත් කරන්න පටන් ගත්තා. තෙල් ඒ කාසිය මැද්දේ කුඩා සිදුරෙන් ලබු කැටයට ඇතුලට වැටුණා. එ වැඩේ ඉවර කළාට පස්සේ ඒ තඹ කාසියේ මත කිසිම තෙල් පැල්ලමක් තිබුණේ නෑ.

'බලන්න. මම හැම දාම මේක කරන නිසා තමයි දැන් මේ විධියට කරන්න පුළුවන් වෙලා තියෙන්නේ. ඒ හින්දායි මා කීවේ මේ වගේ වැඩ සාමාන්‍ය ශිල්ප කියා.' මහල්ලා නිහතමානිව කිව්වා. චෙන් කාං සූට හොඳටම ලැජ්ජා හිතුණා. එදා සිට ඔහු අහංකාර නොවී උද්‍යෝගිවත්ව තමන්ගේ ශිල්පය තව තවත් දියුණු කර ගැනීමට උත්සාහ කරන්න පටන් ගත්තා. අවසානයේ ඔහුගේ හොඳ නමත් ඔහුගේ දුනු ශිල්පය වගේම ප්‍රසිද්ධ වුණා.



# බෙයිජිං පිළිස්සූ තාරාවා





බෙයිජිං පිළිස්සූ තාරාවා ලෝකය පුරා ප්‍රසිද්ධියට පත් ආහාරයක්. ලෝකය පුරා විවිධ රටවල බෙයිජිං තාරා අවන්හල් තිබෙනවා. එහෙත් බෙයිජිං පිළිස්සූ තාරාවාගේ සැබෑ රස බලන්නට නම් බෙයිජිං නුවරට ම එන්න ඕන.

පිළිස්සූ බෙයිජිං තාරාවා චීන රජ පෙළපතට සීමා වී තිබූ සුඛෝපභෝගී ආහාරයක් වුනා. තාරාවා පුළුස්සා සකසන ආකාරය ද මීට අවුරුදු 1600කට පමණ කලින් රාජකීය මුළුතැන්ගෙය තුළ සිදු කෙරුණු නිර්මාණාත්මක සොයාගැනීමක්.

සැබෑ බෙයිජිං පිළිස්සූ තාරාවා ෆම් දැව මගින් පුලුස්සන්න ඕන. එවගේම උදුනේ උෂ්ණත්වය හරියටම පාලනය කරනවා. පදමට පිළිස්සුනු පසු තාරාවා විනාඩි 50කින් පසු උදුනෙන් බාගන්නවා. ඉන්පසු විනාඩි කිහිපයක් තුළ සම හා මස් සහිත ක්‍රමානුකූලව කැබිලි 100කට පමණ කපනවා. සිසිල් පෑන් කෙක් මතට පිපිඤ්ඤා පෙති හා හිනියට කපන ලද ලික්ස් දමනවා. ඊට මිහිරි සෝස් වාර්ගයක් ද මුසු කොට ඔතා ගැනීමෙන් පිලිස්සූ තාරා සමඟ රස බලනවා.

බෙයිජිං පිළිස්සූ තාරාවන් දැන් මුළු ලෝකය පුරා ම අතිශය ජනප්‍රිය ය. බෙයිජිං පිළිස්සූ තාරා අවන්හල් ලෝකයේ බොහෝ රටවල විවෘත වුනා. ලන්ඩන්, තෝකියෝ, නිව්යෝර්ක්, ලොස්ඇන්ජලීස්, සැන්ෆ්‍රැන්සිස්කෝ බෙල්ග්‍රේඩ් වැනි නගරවලදීත්, ඉන්දුනීසියාව සහ සිංගප්පූරුව වැනි රටවලදීත් දැන් බෙයිජිං තාරා රස බලන්න පුළුවන්.

ඒත් බෙයිජිං තාරාවාගේ සැබෑ රස බලන්නට නම් බෙයිජිං නුවරට ම යන්න ඕන. මන්ද විශේෂ ආහාර පාන දෙමින් තාරා ගොවිපළ වල ලොකු මහත් කරන සුවිශේෂී තාරාවන් සිටින්නේ බෙයිජිං නුවර පමණක් බැවින්.

ඔබත් පිළිස්සූ බෙයිජිං තාරා මස් රස බලන්න එන්න. එහෙම නැත්නම්, ඔබට මුළු ජීවිතයේ සුවිශේෂී රසවත් ආහාරයක රස බැලීමේ අත්දැකීම මඟහැරෙන්න පුළුවන්.

ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං







# බෙයිජිං ඔපෙරාව



"පෙරදිග ගීතනාට්‍යය" හැටියට සැළකෙන චීනයේ බෙයිජිං ඔපෙරාව සාම්ප්‍රදායික චීන ජාතික පරමාදර්ශයක්. එය බෙයිජිංහි හැඩ ගැසී තිබෙන නිසා බෙයිජිං ඔපෙරාව ලෙසින් හඳුන්වනවා.

බෙයිජිං ඔපෙරාවට වසර 200කට වැඩි ඉතිහාසයක් තියෙනවා. චීන බෙයිජිං ඔපෙරාව ආරම්භ කරන ලද්දේ පැරණි ප්‍රාදේශීය නාට්‍ය වර්ග කිහිපයක් එකතුවයි, විශේෂයෙන්ම 18වැනි සියවසේ දකුණු චීනයේ ජනප්‍රිය වූ ප්‍රාදේශීය නාට්‍යයක් වන ඇන් හුවෙයි නාට්‍යයේ සිටයි. පළමුවැනි ඇන් හුවෙයි නාට්‍ය කණ්ඩායම වසර 1790වේදී බෙයිජිං නගරයට පැමිණ එකල චීන රජුගේ උපන් දිනය සඳහා සංදර්ශනයක් ඉදිරිපත් කළා. ඊට පසුව බොහෝ ඇන් හුවෙයි නාට්‍ය කණ්ඩායම් පිළිවෙලින් බේයිජිං නුවරට පැමිණ සංදර්ශන ඉදිරිපත් කළා. බලවත් ජංගමශීලිභාවයක් ඇති ඇන් හුවෙයි නාට්‍ය කණ්ඩායම් වෙනත් නාට්‍ය වාර්ගවලින් නාඩගම් හා රඟ පෑමේ ක්‍රමය ඉගෙන ගැනීමට සමත් වුනා. ප්‍රාදේශීය නාට්‍ය විවිධත්වය බොහෝමයක් බෙයිජිංහි එකතු වී තිබුණු නිසා ඇන් හුවෙයි නාට්‍ය කණ්ඩායම කලාව අතින් ඉක්මනින් දියුණු වුනා. වසර දශක කිහිපයක් තුළ දෙමුහුන් කිරීමෙන් පසුව 19වැනි සියවසේ අග භාගයේ සිට 20වැනි සියවසේ මුල් භාගය දක්වා කාලය තුළ බෙයිජිං ඔපෙරාව හැඩ ගැසී ඇති අතර චීනයේ විශාලතම නාට්‍ය වර්ගයක් බවට පත් වුනා.

මුහුණ වැස්ම බෙයිජිං ඔපෙරාවේ විශේෂ ලක්ෂණය-ක් සහිත කලාවක්. චරිතයන්ගේ පක්ෂපාතිත්වය හා දුෂ්ටකම, සුන්දරත්වය හා පිළිතුළ, හොඳ හිත හා නරක හිත සහ ගරුත්වය හා පහත්කම යන හැම එකක් ම වාගේ මුහුණු වැස්ම මගින් පැහැදිලිව පිළිබිඹු වෙන්න පුළුවන්.

18වැනි සියවසේ අග භාගයේ බෙයිජිං ඔපෙරාව දියුණු වීමේ පළමුවැනි මුදුන් කාලය ලෙස සැලකෙනවා. එකල ජනතාව අතර නාට්‍යය බොහෝ විට ඉදිරිපත් කළා පමණක් නොව රාජ්‍ය මාලිගාවේ අභ්‍යන්තරයේත් නිතර ම නාට්‍යය ඉදිරිපත් කර තිබෙනවා. රජ මාලිගාවේ නාට්‍යය සහ ජන නාට්‍යය එකිනෙකට බලපෑ නිසා බෙයිජිං ඔපෙරාව පෙර නොවූවිරූ අන්දමට දියුණු වී තියෙනවා.

පසුගිය සියවසේ 20දශකයේ සිට 40 දශකය දක්වා බෙයිජිං ඔපෙරාව දියුණු වීමේ දෙවැනි මුදුන් කාලයයි. බෙයිජිං ඔපෙරාවේ පිල් රැසක් ඇති වුනා. මෙයි, ශාං, චොං සහ සුන් යන ප්‍රධාන පිල් හතර ඉතාම ප්‍රසිද්ධයි.

චීනයේ ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය ක්‍රියාත්මක කිරීමෙන් පසු බෙයිජිං ඔපෙරාව නව දියුණුවක් ලබා ගෙන තියෙනවා. වර්තමානයේ බේයිජිං ඔපෙරාව චීනය හා විදේශ රටවල් අතර සංස්කෘතික හුවමාරුවේ රඳවා තබා ගනු ලැබූ අංකයක් බවට පත් වෙලා තියෙනවා.





ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං





# නිල් හා සුදු පිඟන් භාණ්ඩ



නිල් හා සුදු පිඟන් භාණ්ඩ යන්න, චීන භාෂාවෙන් 'චිංහුවාත්ස' හෝ 'බයිදී චිංහුවාත්ස' යනුවෙන් උච්චාරණය කෙරේ. මෙය සරළව 'චිංහුවා' යනුවෙන් ද නිතර කියැවෙයි. නිල් හා සුදු පිඟන් භාණ්ඩ, චීන පිඟන් භාණ්ඩවල ප්‍රධාන වර්ගයකි. මෙය වර්ණ මත ඔප දැමුම් ද්‍රව්‍ය යොදන ලද පිඟන් භාණ්ඩ වර්ගයට අයත් වෙයි. නිල් හා සුදු පිඟන් භාණ්ඩ සෑදීමේදී, කොබෝල්ට් ඔක්සයිඩ් සහිත කොබෝල්ට් ලෝපස් යොදා ගනිමින් පිඟන් මැටිවලින් සෑදූ අච්චුව මත මෝස්තර අඳියි. අනතුරුව, එය මත ඔප දැමුම් ද්‍රව්‍ය යොදා අධිතාප ඔක්සිහාරක දැල්ලකින් එක් වරක් පිළිස්සීමෙන් මෙය සාදනු ලැබේ. එහි නිල් පැහැති මෝස්තරවලට සුන්දර, පැහැදිලි සහ පවිත්‍ර ලක්ෂණ හිමි ය. ස්ථාවර නිල් පැහැය, ක්ෂය නොවන සුළු ය.

නිල් හා සුදු පිඟන් භාණ්ඩ මුලින්ම බිහි වූයේ ටාං සහ සොං යන යුග දෙකේදී ය. එහෙත්, මෙම කලා ශිල්පය සම්පූර්ණ වූයේ යුආන් යුගයේ ජිංදචෙන් නගරයේදී ය. විශේෂයෙන්ම, නිල් හා සුදු පිඟන් භාණ්ඩ චීන පිඟන් භාණ්ඩ නිෂ්පාදනයේ ප්‍රධානතම ප්‍රවණතාව බවට පත් වී තිබිණ. චිං යුගයේ 'කාංෂි' රජු සමයේදී, මෙබඳු නිෂ්පාදනය සමෘද්ධිමත්ම යුගයට පිවිසිණ. ලෝ පුරා ප්‍රකට වී ඇති මෙම පිඟන් භාණ්ඩ, චීනයේ පිඟන් භාණ්ඩවල සංකේතය බවට පත් වී තිබේ. මේවායේ සම්පූර්ණ පිලිස්සුම් ශිල්ප ක්‍රමය, වර්ණ මත ඔප දැමුම් ද්‍රව්‍ය යෙ-ාදන ලද පිඟන් භාණ්ඩ සෑදීමේ විශාලතම ජයග්‍රහණය වශයෙන් සැළකේ.

චීනයේ ජියාංෂි පළාතේ ඊසානදිග ප්‍රදේශයේ කුඩා උප නගරයක් පිහිටා තිබේ. මෙම උප නගරය මුලින්ම හැඳින්වූයේ 'ෂින්පිං' යන නමිනි. මෙය පිහිටා ඇත්තේ චාං ගංගාවේ දකුණු ඉවුරේ ය. පහසු මහා මාර්ග හා ජල මාර්ග හිමි මෙම උප නගරයට සරුසාර පතල් සම්පත් හිමි වෙයි. කෙයොලින් පිඟන් මැටි, පිඟන් ගල් සහ ගිනි මැටි විශාල ප්‍රමාණයක් එහි භූගතව පිහිටා තිබේ. මේවා, පිඟන් භාණ්ඩ සෑදීමේ මනා ගුණාත්මකභාවයකින් යුත් අමුද්‍රව්‍ය වශයෙන් සැළකේ. එමෙන්ම, එහි වනාන්තර ගහණ ය. පයින් ගසින් සරු ය. පෝරණු තුළ පිඟන් මැටි පිළිස්සීමේ ඉන්ධනය මෙයයි. සොං යුගයේ 'ජිංද' රජු සමයේදී, මෙම උප නගරය ප්‍රසිද්ධියට පත් වූයේ අධිරාජ්‍ය පිඟන් භාණ්ඩ සෑදීම හේතුවෙනි. ඉන් පසුව, මෙම ප්‍රදේශය, 'ජිංදචෙන්' යන නමින් හැඳින්විණ. යුආන් යුගයට පිවිසීමෙන් පසු, 'ජිංදචෙන්' සීඝ්‍රයෙන් වර්ධනය වී තිබිණ. යුආන් යුගයේ ප්‍රථම රජු වූ 'හුබිලියැ' රජු සමයේ 15වන වසරේදී (ක්‍රි.ව. 1278), විශිෂ්ටතම ස්වාභාවික හා භූගෝලීය පහසුකම් හිමි 'ජිංදචෙන්'හි පිඟන් භාණ්ඩ සෑදීමේ එකම රාජ්‍ය ආයතනය චීනය තුළ



ස්ථාපිත කෙරිණ. ඉන් පසුව, ‘ජිංදචෙන්’ට පෙරට වඩා ප්‍රමාණයක් ශ්‍රමිකයන් හා ධනය හිමි ව තිබිණ. පිරිවැය නොතකා නිෂ්පාදනය කළ හැකි වූ නිසා, පිඟන් භාණ්ඩ වඩා නිර්මාණශීලි හා අපූරු ලෙස නිපදවනු ලැබිණ. සම්පූර්ණ ශිල්පය සහ සුන්දර රූපය සහිත ‘යුවාන්චිංහුවා’ නමැති නිල් හා සුදු පිඟන් භාණ්ඩ වර්ගය බිහි වූයේ ඒ කාලයේදී ය.

‘යුවාන්චිංහුවා’ පිඟන් භාණ්ඩ විනිවිද පෙනෙන සේ දීප්තිමත් ය. එහි නිල් පැහැති මෝස්තර ඉතාමත් අසිරිමත් ය. ‘යුවාන්චිංහුවා’ බිහි වීමත් සමඟම, චීනයේ පිඟන් භාණ්ඩ සෑදීමේ සෙසු මධ්‍යස්ථාන වේගයෙන් පිරිහීමට ලක් වූ අතර පිඟන් භාණ්ඩ කර්මාන්තයේ මධ්‍යස්ථානය බවට ‘ජිංදචෙන්’ පත් විය. වසර දෙදහසකට අධික කාලයක් තිස්සේ හරිතමිණි හෝ රිදී පැහැවලට සමාන ඔප දැමුම් ද්‍රව්‍ය දමන ලද පිඟන් භාණ්ඩ සෑදීමේ ඉතිහාසය එසේ අවසන් විය. එදා සිට, නිල් හෝ සුදු හෝ සෙසු වර්ණ මත ඔප දැමුම් ද්‍රව්‍ය දමන ලද පිඟන් භාණ්ඩ සහ ඔප දැමුම් ද්‍රව්‍ය මත වර්ණ දමන ලද පිඟන් භාණ්ඩ අභිබවා චීනයේ පිඟන් භාණ්ඩ අතරින් වඩාත්ම දීප්තිමත්ව කැපී පෙනුණේ ‘යුවාන්චිංහුවා’ ය.

මිං යුගයේදී, නිල් හා සුදු පිඟන් භාණ්ඩ ‘ජිංදචෙන්’හි ප්‍රධාන නිෂ්පාදිතය බවට පත් වී තිබිණ. අච්චු මත චිත්‍ර ඇඳීමට භාවිත කළ කොබෝල්ට් ද්‍රව්‍ය හා ශිල්ප සහ චිත්‍රවල අන්තර්ගතය වෙනස් වූ නිසා, මිං යුගයේ අදියරෙන් අදියරට සෑදූ මෙම පිඟන් භාණ්ඩ වෙනස් ය. මිං යුගයේ මුල් භාගයේ සෑදූ මෙම පිඟන් භාණ්ඩවල නිල් පැහැය ගැඹුරු මෙන්ම ඝන ය. මධ්‍යම භාගයේ සෑදූ ඒවාවලින් ලා නිල් පැහැයක් පෙනේ. අවසාන භාගයේ සෑදූ ඒවා තඹ පැහැයට හුරු ගැඹුරු නිල් පැහැයෙන් යුක්ත ය. අග භාගයේ එය නැවත ලා නිල් පැහැය බවට පත් විය. මිං යුගයේ සෑදූ නිල් හා සුදු පිඟන් භාණ්ඩ සමෘද්ධිමත්ම තත්ත්වයට ළඟා වූයේ ‘යොංල’ සහ ‘ෂුවාන්ද’ රජු සමයන්හිදී ය. එම සමයන්හි සෑදූ පිඟන් භාණ්ඩ, මුතු ඇට හා හරිතමිණ සේ ඉහළ වටිනාකමෙන් යුක්ත ය. ‘ජිංදචෙන්’හි සෑදූ නිල් හා සුදු පිඟන් භාණ්ඩ මිං යුගයේ ‘යොංල’ රජු සමයේ සිට සමෘද්ධිමත් වීම ආරම්භ විය. ‘යොංල’ සමය මෙන්ම ‘ෂුවාන්ද’ රජු සමය ද, මෙම පිඟන් භාණ්ඩවල ස්වර්ණමය කාලය බවට පත් විය. ‘යොංල’ සමයේ සිට, එවක චීනයට ආවේණික පැහැදිලි හා සරළ සාම්ප්‍රදායයන්ට අනුකූලව සාදනු ලැබූ නිසා, මෙය එවක චීනයේ පිඟන් භාණ්ඩවල ප්‍රධානතම වර්ගය බවට පත් විය. එමෙන්ම, මෙය ‘ජිංදචෙන්’හි වැදගත්ම නිෂ්පාදන වර්ගය බවට ද පත් විය. සම්පූර්ණ ශිල්පය සහ ගැඹුරු නිල් පැහැය, ‘යොංල’ සහ ‘ෂුවාන්ද’ රජු සමයන්හි නිපදවූ නිල් හා සුදු පිඟන් භාණ්ඩවල විශේෂ ලක්ෂණ වෙයි.

චිං යුගය, නිල් හා සුදු පිඟන් භාණ්ඩ පිළිබඳ කලා ශිල්ප සංයෝග වීමේ සමයයි. ප්‍රධාන ස්ථානයේ



පසු වූ මෙම පිඟන් භාණ්ඩ, චිං අධිරාජ්‍ය පවුල මෙන්ම, සාමාන්‍ය පවුල් ද භාවිත කළහ. එමෙන්ම, එහි භාවිතය ලෝකයේ බොහෝ රටවලට විහිදී තිබිණ. කලා ශිල්පය, චිත්‍රවල ස්වභාවය සහ නිපැයුම් ප්‍රමාණය යනාදි ක්ෂේත්‍ර ද සමෘද්ධිමත් වී තිබිණ. එහෙත්, නිල් හා සුදු පිඟන් භාණ්ඩ පිළිබඳ වර්ධනය විශාලතම වෙනසකට මුහුණ දුන්නේ චිං යුගයේදී ය. පිඟන් භාණ්ඩවල කලාත්මකභාවය ස්වර්ණමය මට්ටමට පැමිණි ‘කාංෂි’ රජු සමයේදී, කිරි පැහැති ඔප දැමුම් ද්‍රව්‍යයෙන් සහ තඹ පාටට හුරු රතු පැහැති වර්ණයෙන් සාදනු ලැබූ නව වර්ග ද බිහි විය. නමුත්, ‘චියැන්ලොං’ රජු සමයෙන් පසු, විවිධ සෞම්‍ය වර්ණ මෝස්තර සහිත පිඟන් භාණ්ඩ වර්ග අනුක්‍රමයෙන් වැඩි වීමත් සමඟම, නිල් හා සුදු පිඟන් භාණ්ඩ ප්‍රධාන නිෂ්පාදිතය වුවද එහි නිපැයුම් ප්‍රමාණය සහ ගුණාංත්මකභාවය පිරිහීමට ලක් විය.

නිල් හා සුදු පිඟන් භාණ්ඩවල මනහර සුන්දරත්වය, චීන අනන්‍යතාවක් බවට පත් වී ඇත. ඒ නිසා, මෙය ‘චීන ජාතික පිඟන් භාණ්ඩය’ හා ‘ලෝක නිධානය’ යනුවෙන් හැඳින්වෙයි. චීන සාම්ප්‍රදායික දිය සායම් චිත්‍ර මෙන්ම, නිල් හා සුදු පිඟන් භාණ්ඩවලට ද ආකර්ෂණීය සෞන්දර්යයක් හිමි ය. චීනයේ අනන්‍ය ලක්ෂණ සහ ප්‍රබල කලාත්මකභාවය නිසා මෙම පිඟන් භාණ්ඩ ලෝ පුරා ප්‍රසිද්ධියක් උසලයි.



ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං



# වඳුරාගේ වසරට උදා වූ නව වාණිජ අවස්ථා





චීනයේ ලිත් ක්‍රමයට අනුව පසුගිය පෙබරවාරි 8වැනි දිනයෙන් ආරම්භ වූ චීන නව අවුරුද්ද වඳුරාගේ වසර වශයෙන් හැඳින්වේ. 'වඳුරාගේ වසර' යන්න සඳහන් කරන විට මට නිතැතින්ම චීනයේ ජනප්‍රියතම අද්භූත නව කතාවක් සිහියට නැගේ. සැබෑ ඓතිහාසික කරුණු පදනම් වූ එම නව කතාවේ නම 'අවරදිග සැරිය'යි. එම කෘතියේ බෞද්ධ ග්‍රන්ථ අධ්‍යයනය කිරීමට ඉන්දියාවට ගිය හියුං සාං භික්ෂු වහන්සේ ගැන කියවේ. උන්වහන්සේගේ ප්‍රධාන ගෝලයා වන සුංවු කොං අතිදක්ෂ වඳුරෙකි. ස්වරූප 72කට මාරු විය හැකි ඉන්ද්‍රජාලික හැකියාවක් සතු ව තිබූ මෙම වඳුරා හැම විට ම යුක්තිය වෙනුවෙන් පෙනී සිටි නිර්භීත වීරයෙකි. සාම්ප්‍රදායික වීරයන්ට වඩා වෙනස් වන ආකාරයට නිදහසට දැඩි ලෙස ආදරය කළ මෙම වඳුරා චීන ජාතිකයන්ගේ විශේෂ ආදරය දිනාගෙන තිබේ.

නව වාණිජ සංස්කෘතිය සමග කාලීන සිදු වීම් හා ජනප්‍රිය තේමා හා බොහෝ විට ඈඳෙයි. මේ නිසා චීනයේ වඳුරාට අදාළ වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීම බහුල ව දක්නට ඇත. චීන දේශීය ප්‍රසිද්ධ වෙළෙඳ ලකුණු රැසක වඳුරා විශේෂයෙන් වීර වඳුරා වන සුංවු කොං තේමාගත නිෂ්පාදිත අලුතින් චීන වෙළෙඳ පොලට ඇතුළු වී තිබේ. ඇඳුම් පැළඳුම් මෝස්තර හා ස්වර්ණාභරණ සැලැසුම්වල ද වඳුරාගේ ප්‍රතිරූප යොදාගෙන ඇත.

'අවරදිග සැරිය' චීනයේ මහ පැරණි සම්භාවනීය සාහිත්‍ය ග්‍රන්ථ හතරෙන් එකකි. 1986 වසරේ චීන මධ්‍යම රූපවාහිනි සේවය ඔස්සේ එම ග්‍රන්ථය පදනම් වූ ටෙලි නාට්‍යය විකාශය වූ පසු සුංවු කොං වඳුරා මෙන් ම 'අවරදිග සැරිය' ද කෙරේ අප්‍රමාණ ප්‍රේක්ෂකයන් හා පාඨකයන්ගේ අවධානය යොමු විය.

'සුංවු කොං අපේ චීන අයගේ වඳුරු රජු. වයස් භේදයක් නැතුව හැම චීන කෙනෙකුගේ හිතේ වඳුරු රජෙක් ඉන්නවා. එය සතුටේ සංකේතයක්.' කියා අවරදිග සැරිය ටෙලි නාට්‍යයේ සුංවු කොංගේ චරිතය රඟ පෑ චාං ජින් ලයි නළුවා පවසා තිබේ.

ප්‍රේක්ෂකයෝ හා පාඨකයෝ එදිනෙදා ජීවිතයේදී වෙළෙඳ භාණ්ඩ මිළදී ගන්නා පාරිභෝගිකයන් වෙති. ඔවුන් වඳුරු රජු සමග බැඳී ඇති මානසික ලෙන්ගතුකම ඔවුන්ගේ පාරිභෝගික හැසිරීම්වලට බල පාන බව පලපුරුදු ව්‍යාපාරිකයෝ හොඳින් දනිති.

චීනයේ ව්‍යාප්ත වෙමින් තිබෙන ප්‍රසිද්ධ විදේශීය වෙළෙඳ ලකුණු චීන පාරිභෝගිකයන් වඩාත් සතුටු කරවන්නට වඳුරා හා සම්බන්ධ අතුරු නිෂ්පාදිත නිර්මාණය කර තිබීම මෑතදී චීන වෙළෙඳ පොලේ මතු ව ඇති විශේෂ ලකුණකි. උදාහරණ වශයෙන්, ලෝප්‍රකට KFC අවන්හල් දාමය චීන පාරිභෝගිකයන් ඉලක්ක කරගෙන ඇමෙරිකානු ඩොලර් 30ක පමණ මිලැති වඳුරු රජු සෙල්ලම් බඩු කට්ටලයක් හා ඊට අනුබද්ධ කාටූන් පොත් තුනක් වෙළෙඳ පොලට නිකුත් කර තිබේ. ඇමෙරිකානු දැවැන්ත ආහාර ව්‍යාපාරයක් වන Mondelez සමාගම සාම්ප්‍රදායික චීන කඩදාසි කැපුම් කලාව උපයෝගී කරගෙන සිය කඩදාසි කැපුම් වඳුරු පිළිබඳ ත්‍යාග පාර්සල සැලැසුම් කර ඇත.

චීන සංස්කෘතික පසුබිම පදනම් කර ගෙන නිෂ්පාදිත සැලැසුම් කරන අතර එම සංස්කෘතික පසුබිමට බැඳී සිටින පාරිභෝගිකයන්ගේ පුද්ගලික හැඟීම් උසිගන්වමින් සිය නිෂ්පාදිත හා සේවා ලබා දීමට චීනයේ වාණිජ ලාභ සොයමින් යන විදේශ ව්‍යවසායන්ට පෙරට වඩා හැකි ව තිබේ. ඒ තුළින් විදේශීය ව්‍යවසායන් චීන පාරිභෝගිකයන්ට විකුණන්නේ නිෂ්පාදිත පමණක් නොවේ. චීන සංස්කෘතික සාධක අඩංගු සහ චීන ජාතිකයන්ගේ හැඟීම් අවුලුවාලන වෙළෙඳ භාණ්ඩ විකිණීමයි ඔවුන්ට අවශ්‍ය වී ඇති බව පෙනෙයි.

ඉදිරිපත් කිරීම : ෂෙං ලී







# චීන සැන් චියයාං යුඅන් නව ජෛව පරිසරයකින් පොහොසත් කලාපය



ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා

සැන් චියයාං යුඅන් චීන භාෂා අර්ථය වන්නේ ගංගා තුනේ ආරම්භක ස්ථානය යන්නයි. චීනයේ විශාලතම ජාතික ස්වභාවික සුරක්ෂිත කලාපයක් ලෙසට සැලකෙන සැන් චියයාං යුඅන් පිහිටා තිබෙන්නේ බටහිර චීන චියිං හැයි පළාතේ.චීන ප්‍රධාන ගංගා වන යැන්සි ගංගාව, කහ ගංගාව හා ලැන් ස්චන් ගංගාව ආරම්භ වන්නේ එකට ස්ථානයෙනි. එමෙන්ම මේ ප්‍රදේශය චියිං හැයි - ටිබෙට් සානුවේ මධ්‍යය කලාපය නිසා සාමාන්‍ය උස මුහුද මට්ටමෙන් මිටර් 4000 කට වැඩියි. සමස්ත භූමි ප්‍රමානය වර්ග කිලෝ මීටර් ලක්ෂ 3කි.

ආසියාවේ වැදගත් ජල සම්පතින් සපිරි කලාපයක් ලෙසට මෙම සුරක්ෂිත කලාපය සැලකේ. එහෙත් විසි වන ශතවර්ෂයේ මානාව ක්‍රියාකාරකම්, දේශගුණ විපාර්යාසය යන හේතුවෙන් මේ කලාපයේ තණ බිම් හා සුළු ගංගා වැව් ප්‍රමාණය වසරෙන් වසර අවම වී තිබේ. මෙම තත්ත්වය යටතේ මේ ප්‍රදේශයේ ජෛව පද්ධතිය සුරක්ෂිත කිරීම සඳහා චීන රජය විවිධ පිවරය ක්‍රියාත්මක කර ඇත.

මේ ප්‍රදේශයේ ජෛව පද්ධතිය සුරක්ෂිත කිරීමේ ප්‍රධාන ගැටළු වන්නේ පශු සම්පත ප්‍රමාණය වැඩි වීමයි. අධික උලාකෑම හේතුවෙන් ස්වභාවික එඬේර කලාපය වේගවත්ව අඩු වී තණ බිම් අව ප්‍රමාණය වී තිබේ. එහෙත් පශු සම්පත ප්‍රමාණය අඩු වීම බොහෝ අසීරුතා මුහුණ දී තිබේ. දැනට මේ ප්‍රදේශයේ ජිවත් වන ජනතාවගෙන් 90% ක් ටිබෙට් සුළු ජාතින්. ඔවුහු සාම්ප්‍රදායික පශු පාලන කර්මාන්තයේ යෙදෙති. නිසි ආකාරයෙන් මෙම ගැටළු විසඳා ගැනීමට චීන රජය චීන යුවන් බිලියන 100 ක් මුදලක් වෙන් කර තිබේ.

2005 වසරේ සොබා දහම් සුරැකුම් කලාපය ජෛව සුරක්ෂිත කිරීම හා සංවර්ධන සැලැස්ම චීන රාජය මණ්ඩලය විසින් සම්මත කෙරිණ. ජෛව සුරක්ෂිත කිරීම ව්‍යපෘතියේ පළමු වන අදියර නිල වශයෙන් ආරම්භ වී ඇත. සමස්ත සුරක්ෂිත කලාපය කිලෝ මිටර් ලක්ෂ 1.5කි. මේ ප්‍රදේශයේ ජෛව පරිසර යළි යහපත් කිරීම සැලැස්මේ අරමුණයි.

ගත වූ වසර 10ක කාලය තුළ මේ කලාපයේ ගොපල්ලන් ලක්ෂයක වෙනත් ප්‍රදේශවලට යොමු කර පශු සම්පත් කර්මාන්තය අඩු කර තිබේ.එමෙන්ම නව ජෛව තක්ෂණය යොදා ගනිමින් මේ වනවිට චීන සැන් චියයාං යුඅන් ජාතික ස්වභාවික සුරක්ෂිත කලාපය තණ බිම් ප්‍රමාණය වැඩි වී තිබේ.

ඉහත සදහන් කළ පියවර පමණක් නොව නව පශු පාලන කර්මාන්ත ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද චීන රජය ක්‍රියා කරයි. සමූහ සත්ව හොව්පළ හා කොටුවල සතුන් බෝ කිරීම යන ක්‍රම යොදා ගනිමින් මෙම ප්‍රදේශයේ ගම් 883කදී ජෛව සත්ව ගාල ඉදි කර ඇත.

පසුගිය 2014 වසරේ සිට සැන් චියයාං යුඅන් ජාතික ස්වභාවික සුරක්ෂිත කලාපය ජෛව සුරක්ෂිත කිරීම පිළිබද ව්‍යපෘතිවලට චීන යුවන් බිලියන 12ක් අයෝජන කර තිබේ.ඉඩම් කාන්තාරකරණය වැලැක්වීම වනාන්තර නැවත වගාව යන ව්‍යපෘති හරහා යහපත් ප්‍රතිඵල ලබා ගත් බව චීන පරිසර සුරක්ෂිත දෙපාර්තමෙන්තුව සදහන් කරයි.









# නූතන කෘෂිකර්මාන්තයට යොමුවන ප්‍රාග්ධන වෙළඳ පොළ අවධානය



ඉදිරිපත් කිරීම : චෙන් ගුවැන් වන්



චීන 13 වන පස් අවුරුදු සැලැස්මට අනුව ඉදිරියේදී නූතන කෘෂිකර්මාන්ත විද්‍යා නිර්මාණශීලි පද්ධතිය සංවර්ධනය කිරීම, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණය ඉදිරියට ගෙන යාම, කෘෂිකර්මාන්තය හා තොරතුරු තාක්ෂණය මිශ්‍ර වීම, බුද්ධිමත් කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීම හා කෘෂිකාර්මික නිෂ්පාදිත මට්ටම ඉහළ යාමට චීනය අවධාරනය යොමු කරයි. ඒ හේතුවෙන් ඇතැම් විශ්ලේෂකයන් විශ්වාසය පළ කරන්නේ ඉදිරි වසර 5ක් තුළ චීන නූතන කෘෂිකාර්මික මට්ටම කැපී පෙනෙන ලෙස ඉහළ යා හැකි බවයි.

නූතන කෘෂිකර්මාන්තය නූතන විද්‍යා තාක්ෂණය හා නූතන කර්මාන්තය නිෂ්පාදන මාධ්‍ය හා විද්‍යාත්මක පාලන ක්‍රමය භාවිත කරන සාමාජීය කෘෂිකර්මාන්තයෙන් සමන්විතයි. එය කෘෂිකාර්මික ඉතිහාසයේ වැදගත් සමයකි. සංවර්ධිත රටවල සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය

නූතන කෘෂිකර්මාන්තය බලා සංක්‍රමණය කරන ක්‍රියාදාමය දකින විට අපට දැන ගත හැක්කේ කෘෂිකාර්මික නවීකරණයේදී ප්‍රධාන කරුණු දෙකක් ඇති බවයි. එම කරුණු දෙකින් එකක් කෘෂිකාර්මික නිෂ්පාදන කොන්දේසි හා තාක්ෂණික නවීකරණයයි. විද්‍යා තාක්ෂණය හා නිෂ්පාදන සාධකය මගින් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණය, තොරතුරුකරණය හා විද්‍යාකරණය ළඟා කර ගැනීම මෙම අන්තර්ගතයයි. සෙසු කරුණ නම් කෘෂිකාර්මික පාලනය නවීකරණයයි. විද්‍යාත්මක පාලන ක්‍රමයෙන් ප්‍රයෝජන ගැනීම මගින් කෘෂිකාර්මික නිෂ්පාදන වෘත්තීය ළඟා කර ගනී.

නව ආර්ථික තත්වය යටතේ කෘෂිකර්මාන්තය විශාල අවස්ථා සහිත කර්මාන්තයකි. අදාළ ආයතනය නිකුත් කළ වාර්තාවට අනුව චීන කෘෂිකර්මාන්ත හා ආහාර වාර්ෂික වටිනාකම චීන යුවාන් බිලියන 9300කි. කෘෂිකර්මාන්ත ප්‍රාග්ධන වෙළඳ පොළ පරිමාණය චීන යුවාන් බිලියන බිලියන 2200කි. 2015 වසරේ චීනයේ පරිභෝජන භාණ්ඩ සිල්ලර අලෙවි සමස්ත ප්‍රමාණය චීන යුවන් බිලියන 3000කි. එම නිසා කෘෂිකර්මාන්ත දාමයට සමස්ත කර්මාන්තයෙන් 38.3% හිමි වෙයි. මේ අගය තුළ නූතන කෘෂිකර්මාන්ත වෙළඳ පොල ප්‍රමාණය චීන යුවාන් බිලියන 1000ක මට්ටමට ළඟාවීමට අපේක්ෂා කළ හැකිය. විශාල සැඟවන හැකියාව හේතුවෙන් නූතන කෘෂිකර්මාන්තයට හිමි ප්‍රාග්ධන වෙළඳ පොලේ අවධානය ක්‍රමයෙන් වැඩි වෙයි. ඊට අමතරව මෙවනවිට රජය නූතන කෘෂිකර්මාන්තයට හිතවත් ප්‍රතිපත්ති කීපයක් නිකුත් කර තිබේ. පසුගිය වසරේ සැප්තැම්බර් මස චීන කෘෂිකර්ම අමාත්‍යාංශය, රාජ්‍ය සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කමිටුව, මුදල් අමාත්‍යාංශය හා චීන බැංකු කර්මාන්ත අධීකරණ හා පාලන කමිටුව ඒකාබද්ධව ජාතික නූතන කෘෂිකර්මාන්ත පර්යේෂණාත්මක ප්‍රාදේශීය ප්‍රතිසංස්කරණය හා කෘෂිකර්මාන්ත නවීකරණය පිළිබඳ උපදෙස් නිකුත් කෙරිණ. මීට පෙර රාජ්‍ය සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කමිටුව, කෘෂිකර්ම අමාත්‍යාංශය හා වාණිජ අමාත්‍යාංශය විසින් කෘෂිකර්මික ඉලෙක්ට්‍රෝනික ව්‍යාපාරය සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කරන ලදි.





ඉන් රජය කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන මාධ්‍ය ප්‍රමුඛ කෘෂිකර්මාන්ත ඉලෙක්ට්‍රෝනික ව්‍යාපාරය යහපත් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණ අපට පැහැදිලිව දැකිය හැකි ය. ඊට අමතරව ඉදිරි වසර 5 තුළ කෘෂිකර්මාන්තය සංවර්ධනය පිළිබඳ චීන රජය සහනාධාර ක්‍රම රැසක් හා කෘෂිකර්මාන්තය සම්බන්ධ මුදල් යොමු කිරීමේ ක්‍රමය ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

විවිධ කෘෂිකර්මාන්තයට හිතවත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාග්ධන වෙළඳ පොළේ ලෙනෝවෝ, අලිබාබා, වන්ඩා වැනි ප්‍රකට සමාගම් කෘෂිකර්මාන්ත වෙළඳ පොළට ඇතුළු විය. අදාළ සංඛ්‍යාලේඛණයට අනුව 2007 වසරේ සිට 2015 වසර දක්වා කෘෂිකාර්මික සමාගම් 21ක් කොටස් වෙළඳ පොළේ ලැයිස්තු ගත කර තිබේ. කොටස් වෙළඳ පොළේ එම කෘෂිකාර්මික සමාගම්වල කොටස් වටිනාකම චීන යුවන් බිලියන 15.9ක්. ප්‍රාග්ධනය ආයෝජනය කිරීමෙන් කෘෂිකර්මාන්ත සංවර්ධන ක්‍රමය සංක්‍රමණය කඩිනම් කළ හැකිය. එය කෘෂිකර්මාන්ත නවීකරණයට උපකාරී වෙයි.





# ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය

දකුණුදිග චීනයේ ෆූචයැන් පළාතේ පිහිටි ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය චීනයේ සුන්දරත ම විශ්ව විද්‍යාලයකි. මේ අතර එය එහි ඉහළ අධ්‍යාපන මට්ටමක් හේතුවෙන් ද චීනය පුරා ප්‍රකට ය.

ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය වසර 1921දී චීනයේ ප්‍රකට ව්‍යාපාරික චෙන් ජ්‍යා ගෙන් මහතා විසින් ඉදි කෙරිණ. චීනයේ හොඳ ම විශ්ව විද්‍යාල පිළිබඳ ලේඛනයේ ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය ඉහළ ස්ථානයක් ගනී.

ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා වාර්ෂික ව චීනය පුරා විශිෂ්ට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ විශාල පිරිසක් දැඩි තරගකාරිත්වයකින් යුතුව ක්‍රියා කරති. රට පුරා විශිෂ්ට ශිෂ්‍යයන් ඒක්රැස්වීම හේතුවෙන් වාර්ෂික ව ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය සමාජයට විශිෂ්ට උපාධිධාරීන් විශාල පිරිසක් සපයා දෙයි. එසේ බිහි වූ අය අතරින් බොහෝ දෙනෙක් පසුව චීනයේ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් බවට පත් වූහ. චීනයේ ප්‍රකට උගතෙකු වන ලූ ෂ්වෙන් මහතා ද මෙම විශ්ව විද්‍යාලයේ ඉගෙන ගෙන ඇති පුද්ගලයෙකි. රටේ වෙනත් ක්ෂේත්‍ර රැසක විශිෂ්ඨයන් රාශියකුත් මෙම විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්. ඒ අතර, ජාතික සාහිත්‍ය ත්‍යාගය ලැබූ පුද්ගලයෙක් ද සිටිනවා. තව ද, චීනයේ වත්මන් රාජ්‍ය නායකයෙක් වන චාං ගෝ ලී මහතා, චීනයේ ප්‍රකට ගණිතඥයෙක් වන චෙන් පින් රූ මහතා වැනි පුද්ගලයන් රාශියකුත් ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලත් අය.

ඊට අමතරව, චීනයේ උසස් ම පෙළේ විද්‍යාඥයෝ දහයකට අධික පිරිසක් ද ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලයේ ඉගෙනීම් හා පර්යේෂණ කටයුතුවල නිරත වී සිටිති. ඒ නිසා චීනයේ සංවර්ධනය හා සමෘද්ධිය වෙනුවෙන් ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය මනා පිටුබලයක් බව සඳහන් කළ හැකි ය.

ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය චීනයේ විශ්ව විද්‍යාල අතරින් විශිෂ්ට කළමනාකරණ අධ්‍යාපනයක් නිසා ප්‍රකට ය. එහි ඇති පීඨ 27ක් අතරින් ආර්ථික විද්‍යාව, කළමනාකරණ විද්‍යාව, නීතිය වැනි විෂයයන් වඩා ජනප්‍රිය ය. චීනයේ පශ්චාත් උපාධිධාරි අධ්‍යාපනය සඳහා මෙම විශ්ව විද්‍යාලයේ විශේෂ දායකත්වයක් ලබා දී තිබේ.



මේ වන විට, ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලයේ ගුරුවරුන්ගේ සංඛ්‍යාව 2700 ඉක්මවා ගොස් ඇත. ඒ අතරින් 1700කට වැඩි පිරිසක් ආචාර්ය උපාධි ලබා ගත් අය වෙති. එමෙන් ම, ශිෂ්‍යයන් 40000කට අධික පිරිසක් එහි සිටිති. ඒ අතරින් රටවල් 100කට වැඩි ප්‍රමාණයකින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ පිරිසක් සිටීම විශේෂත්වයකි.

මෑත කාලයේ උසස් අධ්‍යාපනය හැදෑරීම පිණිස චීනයට පැමිණි විදේශ ශිෂ්‍යයන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙයි. මෙවැනි පසුබිමක් යටතේ, ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය වැනි චීනයේ ඉහළ ම පෙළේ විශ්ව විද්‍යාල විදේශ ශිෂ්‍යයන්ගේ වැඩි අවධානයක් ඇද ගනී. මෑත වසරවල ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලයේ අංශ රැසක් ද විදේශ ශිෂ්‍යයන් බඳවා ගනී. සාමාන්‍ය උපාධිය සඳහා විදේශ ශිෂ්‍යයෙකුට මෙහි අවුරුදු 4ක් ඉගෙන ගැනීමට අවශ්‍ය ය. මාධ්‍ය, සන්නිවේදනය වැනි විෂයයන් අධ්‍යයනය කළ හැකි ය. ගුරුවරුන් බහුතරය චීන ජාතිකයන් වීම නිසා සාමාන්‍යයෙන් ශිෂ්‍යයන්ට උගන්වනු ලබනුයේ චීන භාෂාවෙනි. ඒ නිසා විදේශ ශිෂ්‍යයන් පැමිණි මුල් කාලයේදී චීන භාෂාව අධ්‍යයනය කළ යුතු ය. එහෙත්, ඉන්ග්‍රීසි භාෂාවෙන් ද ඉගැන්වීම් කටයුතු සිදු වෙයි. පශ්චාත් උපාධිය සඳහා සාමාන්‍යයෙන් අවුරුදු 2, 3ක් ගත වෙයි. ආචාර්ය උපාධිය සඳහා අවුරුදු 4ක් අවශ්‍ය ය.

නිල උපාධි අධ්‍යාපනයට අමතරව, කෙටිකාලික පුහුණු සහ හුවමාරු අධ්‍යාපන වැඩසටහන් ද ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය සපයයි. ඒවැනි අධ්‍යාපනයක් ලබන විදේශ ශිෂ්‍යයෝ සාමාන්‍යයෙන් මෙහි අවුරුදු 1, 2ක් පමණ සිටිති. ඔවුන්ට උපාධිය වෙනුවට සහතික පත්‍රයක් හිමි වෙයි.

ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලයට ඉතා විශිෂ්ට පහසුකමක් හිමි වෙයි. පන්ති කාමර, නේවාසික කාමර විශාල ප්‍රමාණයකට අමතරව, ක්‍රීඩාංගන කිහිපයක් ද එහි තිබේ. ඒ අතරින් ප්‍රේක්ෂකයන් සුවිශාල පිරිසකට පහසුකම් සැලකිය හැකි ක්‍රීඩා සංකීර්ණයක් ද තිබේ. පිහිනුම් තටාක කිහිපයක් ද එහි ඇත. ඊට අමතරව, ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳ පොත්පත්, ලිපිලේඛන මිලියන 4කට ආසන්න සංඛ්‍යාවක් සහිත නවීන පුස්තකාලයක් ද එහි ඇත. ඒ නිසා ජීවිතය සහ අධ්‍යාපනය පිළිබඳව ඔබට එහි පහසුවක් ලැබෙයි.

ෂ්‍යා මෙන් විශ්ව විද්‍යාලය පිළිබඳ වැඩිපුර තොරතුරු සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න.

http://www.xmu.edu.cn/



ඉදිරිපත් කිරීම : හැන් ජ්යැන්








# ලෝකයේ ලාබාලම පියානෝ විශාරදයා



ලන් ලන්, චීනයේ සුප්‍රකට පියානෝ වාදකයෙක්. 1982 වසරේ ජුනි මාසයේ 14වැනිදා ලන් ලන් ඉපදුනේ ඊසාන චීනයේ ලිඕ නිං පාලතේ ය. ඔහුගේ පවුලේ සාමාජිකයෝ සියල්ලෝම සංගීතයට කැමති වූහ. ඔහුගේ සීයා පාසලේ සංගීත ගුරුවරයෙකි. ඔහුගේ පියා හමුදාවේ සංස්කෘතික කටයුතුවලට සම්බන්ධව ක්‍රියා කරමින් සිටියේ ය. ඔහුගේ මව ද පාසල් කාලයේ සිටම නැටුම් ගැයුම්වලට ඉතාම ප්‍රියතාවක් දැක්වූවා ය. පවුලේ බලපෑම යටතේ ලන් ලන් කුඩා කාලයේ සිටම සංගීතයට කෙරෙහි ලොකු උනන්දුවක් දැක්වූවේ ය. අවුරුදු දෙක පමණ වයසේ පසුවේද්දී ලන් ලන් රූපවාහිනී පියානෝ ප්‍රසංගයක් නරඹා පියානෝවට ඇළුම් කළේ ය. මේ දුටු ඔහුගේ පියා ලන් ලන්ට පියානෝ උගන්වීමට පටන් ගත්තේ ය. තුන් හැවිරිදි වියේ පසු වූ ලන් ලන් ශැන් යන් නගරයේ සංගීත ඇකඩමියේ මහාචාර්ය වරයෙකු යටතේ නිළ වශයෙන් පියානෝ ඉගෙන ගැනීමට



ආරම්භ කළේ ය. අවුරුදු පහ වයසේ පසුවේද්දී ලන් ලන් ඊසාන චීනයේ පළාත් තුනේ ළමා පියානෝ තරගයේ පළමුවැනි ස්ථානය දිනා ගත්තේ ය. ඒ මෙන්ම තරගයට පසු ලන් ලන් සිය ප්‍රථම පියානෝ ප්‍රසංගය පැවැත්විය. 1993 වසරේ අවුරුදු එකොළොහ වයසේ පසුවේද්දී ලන් ලන් සමස්ත චීනයේ ළමා පියානෝ තරගයේ ප්‍රථම ස්ථානය හිමි කර ගත්තේ ය. ඊට අමතරව දෙවැනි වසරේ ලන් ලන්ට ජර්මනියේ පැවති සිව්වැනි ජාත්‍යන්තර තරුණ සහ ළමා පියානෝ තරගයේ ළමා කණ්ඩායමේ පළමුවැනි ස්ථානය හිමි විය. ලන් ලන් දිනා ගත් ප්‍රථම ජාත්‍යන්තර සම්මානය මෙයයි. ඒ කාලයේ ලන් ලන් චීන මධ්‍යම සංගීත ඇකඩමියේ පියානෝ ඉගෙන ගනිමින් සිටියේ ය. 1995 වසරේ ජපානයේ පැවති ලෝකයේ විශාලතම බලපෑම පවතින තරුණ පියානෝ තරගය වන දෙවැනි Tchaikovsky ජාත්‍යන්තර තරුණ පියානෝ තරගයේදී ඔහු යළිත් පළමුවැනි ස්ථානය හිමි කර ගත්තේ ය. මෙම තරගයේ සම්මානය දිනා ගැනීමෙන් පසු ලන් ලන් චීන මධ්‍යම සංගීත ඇකඩමියෙන් ඉවත් වී ඇමෙරිකාවේ Curtis සංගීත ඇකඩමියට ප්‍රවේශ විය. එහිදී ලන් ලන්ට සංගීතය පමණක් නොවෙයි, බටහිර



රටවල ඉතිහාසය හා සංස්කෘතිය ඉගෙන ගැනීමට හැකි විය. ඒ මෙන්ම ලන් ලන්ට වෙනත් ප්‍රසිද්ධ සංගීත කණ්ඩායම් සමග ප්‍රසංගය පැවැත්වීමේ අවස්ථාව හිමි විය. ඊට පසු වසර කිහිපයක් තුළ ලන් ලන් විවිධ සංගීත කණ්ඩායම් සමග ලෝ පුරා වැදගත් ප්‍රසංග රැසක් ඉදිරිපත් කළේ ය. 2004 වසරේ ඇමෙරිකාවේ CNN රූපවාහිනී සේවයේ ලන් ලන් පිළිබඳ විශේෂ වාර්තා වැඩසටහනක් විකාශනය කළේ ය. ඒ මෙන්ම ඇමෙරිකාවේ CBS රූපවාහිනී සේවය ලන් ලන් පිළිබඳව පැයක විශේෂ වැඩසටහනක් විකාශනය කර තිබේ. 2004 වසරේ ඔක්තෝබර් මාසයේ ලන් ලන් ඇමෙරිකා ජනාධිපති George Bush මහතාගේ ආරාධනාවකට අනුව ධවල මන්දිරයේ පියානෝ ප්‍රසංගයක් පැවැතිවිය. ලන් ලන් ධවල මන්දිරයේ ප්‍රසංගය පැවැත්වූ ප්‍රථම චීන පියානෝ වාදකයා බවට පත් විය. ප්‍රසංගයෙන් පසු ජනාධිපතිවරයා ලන් ලන්ට ලෝක සාම දූතයා ලෙසට නම් කළේ ය. 2006 වසරේ ලෝකයේ සුප්‍රකට පියානෝව නිෂ්පාදිත සමාගම වන Steinway & Sons සමාගම ලන් ලන් නම් පියානෝව නිෂ්පාදනය කළේ ය. වසර 150ක් තුළ එම සමාගම ප්‍රථම වතාවට චීනයේ බාලම පියානෝ වාදකයාගේ නමින් පියානෝවක් කළේ ය. 2008 වසරේ අගෝස්තු මාසයේ 8වැනිදා බෙයිජිං ඔලිම්පික් ක්‍රීඩා උළෙල ආරම්භ විය. උළෙලේ සමාරම්භක උත්සවයේදී ලන් ලන් විනාඩි අටක පියානෝ වාදනයක් ඉදිරිපත් කර තිබේ. 2013 වසරේ ඔක්තෝබර් මාසයේ 28වැනිදා එක්සත් ජාතීන්ගේ මහා ලෙක්ම බැන් කී මුන් ගෝලීය අධ්‍යාපනයට අවධානය යොමු කිරීමේ එක්සත් ජාතීන්ගේ නියෝජිතයා ලෙසට ලන් ලන් නම් කළේ ය. ඒ මෙන්ම 2015 වසරේ ඔක්තෝබර් මාසයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ 70වැනි සංවත්සරය නිමිත්තෙන් එක්සත් ජාතීන්ගේ මහා ලේකම් බැන් කී මුන් මහතා සහ ලන් ලන් ඒකාබද්ධව අදාළ සැමරුම් ක්‍රියාකාරකම්වලට සහභාගි වූහ. සමාන වසරේ නොවැම්බර් මාසයේ චීන මධ්‍යම සංගීත ඇකඩමිය ලන් ලන් ගෞරව ආචාර්ය වරයෙකු ලෙසට නම් කළේ ය. ලන් ලන් චීන මධ්‍යම සංගීත ඇකඩමිය පිහිටුවීමෙන් පසු ප්‍රථම ගෞරව ආචාර්ය වරයෙකු බවට පත් විය.

ලන් ලන් සංගීත ක්ෂේත්‍රයේ සේවය කරමින් සමාජීය ක්‍රියාකාරකම්වලට සක්‍රිය ලෙස සහභාගි වී තිබේ. 2008 වසරේ ලන් ලන් ජාත්‍යන්තර සංගීත අරමුදලක් ස්ථාපිත කළේ ය. තරුණ සංගීතඥයන් වෙනුවෙන් වඩාත් යහපත් පරිසරය හා වේදිකාව ඉදිරිපත් කිරීම සඳහා ඔහු මෙම අරමුදල ආරම්භ කිරීමේ අරමුණයි. ඒ මෙන්ම ලන් ලන් ලෝකයේ විවිධ රටවල විවිධ සංගීත ඇකඩමියේ පියානෝ වාදනය පිළිබඳ දේශන ඉදිරිපත් පළ කළේ ය. 2008 වසරේ අප්‍රේල් මාසයේ ලන් ලන් ඇමෙරිකාවේ නිව් යෝක්හි Manhattan සංගීත ඇකඩමියේ පියානෝ දේශනයක් ඉදිරිපත් කළේ ය. සමස්ත ඇමෙරිකාවේ සංගීත ගුරුවරුන් සහ ආචාරයවරුන් 2000ක් පමණ එම දේශනයට සවන් දී ඇත. 2004 වසරේ අගෝස්තු මාසයේ ලන් ලන් එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ තානාපතිවරයෙකු වශයෙන් අප්‍රිකාවේ ටැන්සානියාවේ සංචාරය කළේ ය. ඔහු එහිදී රෝග සහ දිළිඳුකම සහිතව ජීවත් වූ දරුවන්ගේ සුවදුක් විමසීමට කටයුතු කර තිබේ.

ලන් ලන් චීනයේ Mozart යැයි වරෙක ප්‍රංශයේ මාධ්‍යවේදීන් අදහස් පළ කළේ ය. 1999 වසරේ ලන් ලන් එම වසරේ ලෝකයේ විශිෂ්ටම පියානෝ වාදකයා වන බව ඇමෙරිකාවේ ක්‍යසප්ටද Tribune යන පුවත්පත සඳහන් කළේ ය. ඒ මෙන්ම වත්මන් ලෝකයේ සාර්ථකම පියානෝ වාදකයා වන බව ජර්මනියේ ලෝක පුවත්වත මෙලෙස පැවසීය.



ඉදිරිපත් කිරීම : බූ යුන්



# 《每日汉语》එදිනෙදා චීන බස

## 在中餐馆 චීන අවන්හලකදී

### 今日关键　අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 你们有什么特色菜？ | නිමන් යො ෂෙන් ම තර් ස් සයි?<br>ඔයාලාගේ තියෙන විශේෂ ව්‍යාංජන මොනවා ද? |
| 你需要刀叉吗？ | නි ෂියු යො ටඕ චා ම?<br>ඔබට පිහියක් හා ගෑරුප්පුවක් අවශ්‍ය ද? |
| 请问你要红茶吗？ | චින් වන් නි යො හුන් චා ම?<br>කරුණාකර ඔයාට රතු තේ ඕන ද? |
| 我们AA制吧。 | වෝ මන් ඒ ඒ චර් බා.<br>අපි බිල බෙදා ගනිමු. |

### 完整对话　සම්පූර්ණ සංවාදය

#### 对话　一　පළමු සංවාදය

| | |
|---|---|
| 你们有什么特色菜？ | නිමන් යො ෂෙන් ම තර් ස් සයි?<br>ඔයාලාගේ තියෙන විශේෂ ව්‍යාංජන මොනවා ද? |
| 烤鸭。你喜欢吗？ | කෞයා. නි ශි හුඅන් මා?<br>බැදපු තාරා මස්වලට ඔයා කැමතියි ද? |
| 喜欢。 | ශි හුඅන්.<br>කැමතියි. |

#### 对话　二　දෙවන සංවාදය

| | |
|---|---|
| 你需要刀叉吗？ | නි ෂියු යො ටඕ චා ම?<br>ඔබට පිහියක් හා ගෑරුප්පුවක් අවශ්‍ය ද? |
| 不。我想试着用筷子。 | බූ. වෝ ෂියං ෂර් ච යොං ක්වයි ස්.<br>එපා. මා කැමති ලී කෝටිටු භාවිත කරන්නට. |

#### 对话　三　තෙවන සංවාදය

| | |
|---|---|
| 请问你要红茶吗？ | චින් වන් නි යො හුන් චා ම?<br>කරුණාකර ඔයාට තේ ඕන ද? |
| 我想尝尝中国绿茶。 | වෝ ෂියං චං චං චොංග් ගෝ ලියු චා.<br>මම චීන කොළ තේ බොන්න කැමතියි. |

#### 对话四　හතරවන සංවාදය

| | |
|---|---|
| 我们AA制吧。 | වෝ මන් ඒ ඒ චර් බා.<br>අපි බිල බෙදා ගනිමු. |
| 下次吧，这次我“买单”（请客）。 | ෂියා ෂ බා, චර් ස වෝ මයි දන් (චිං කර්).<br>ඊළඟ වතාවට. මෙවර මා මිල දෙන්නම්. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

චීන කෑම ඉහුම් පිහුම් කලාව ජාත්‍යන්තරව ලබා ඇත්තේ සුළු පටු ජනප්‍රියතාවක් නොවේ. සංඛ්‍යාලේඛණයන්ට අනුව නා නා විධ චීන ව්‍යාංජන දසදහසක් පමණ ඇතැයි කිව්වොත් ඔබ පුදුම වේවි. ඉතා ඈත අතීතයේ පටන් චීනයේ සෑම පෙදෙසකින්ම දියුණු කොට වඩාත් ප්‍රචලිත කළ දේශීය කෑම වට්ටෝරු රැසක් තියෙනවා. ඒවා අතර ‘ෂැංදොං’, ‘ස් චුආන්’, ‘ගුවං දොං’, ‘චර් චියැං’, ‘ෆු චියැන්’, ‘හූ නාන්’ සහ ‘අන් හුයි’ යන සූප ශාස්ත්‍ර වඩාත්ම ප්‍රචලිතයි කිව්වොත් නිවැරදියි. චීනයේ සූප ශාස්ත්‍ර අට කියලාත් ඊට කියනවා. උදාහරණයක් හැටියට ‘ස් චුආන්’ පළාතේ කෑම අපේ සිංහල කෑම වගේ බොහොම සැරයි. හැබැයි ‘චියැං සූ’ පළාතේ කෑම නම් ටිකක් පැණි රසයි. එතකොට ‘ගුවං දොං’ කෑම බොහොම සැහැල්ලු විදිහටයි සැලකෙන්නේ.

චීන ඩම්ප්ලින් වලට වසර දහසකටත් වඩා පරණ ඉතිහාසයක් තිබෙනවා. එය චීන මිනිස්සු වඩාත් කැමති කෑමක්. ඩම්ප්ලින් කියන්නේ මස් හෝ එළවළු මැදට යොදා වාෂ්පෙන් හෝ උණු වතුරෙන් තම්බා ගන්නා පිටි ගුලි වලින් සෑදූ කෑමකට. විශේෂයෙන්ම චීන වසන්ත උත්සව සමයේදී සෑම චීන නිවසකම ඩම්ප්ලින් හදනවා. අතීතයේදී රන් සහ රිදී යොදා සෑදූ තරමක් ලොකු කාසි මේ ඩම්ප්ලින් වලට ටිකක් සමානයි. ඒ නිසා මිනිස්සු පුරුදු වෙලා ඉන්නවා නව වසරක් උදාවෙන මොහොතේ වැඩි වැඩියෙන් ධනය සහ සම්පත ලැබේවා යන ප්‍රාර්ථනයෙන් මේ රසවත් ඩම්ප්ලින් හදන්න.





## 在自助餐店 විවෘත කෑම මේසයකදී

### 今日关键　අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 请你们等一会儿。 | චින් නි මන් ඩන් ඊ හුර්.<br>කරුණාකරලා ඔයාලා පොඩ්ඩක් ඉන්න. |
| 我们要等多久？ | වෝමන් යො ඩන් ටො චියු?<br>අපි කොච්චර වෙලාවක් ඉන්න ඕනෙ ද? |
| 味道怎么样？ | වේ ටඕ සන් ම යන්?<br>රස කොහොම ද? |
| 真的很好吃。 | චැන් ද හන් හඕ චීර්.<br>ඇත්තටම හුඟක් රසයි. |
| 我吃饱了。 | වෝ චීර් බෝ ල.<br>මගේ බඩ පිරිලා. |

### 完整对话　සම්පූර්ණ සංවාදය

#### 对话　一　පළමු සංවාදය

| | |
|---|---|
| 请你们等一会儿。 | චින් නි මන් ඩන් ඊ හුර්.<br>කරුණාකරලා ඔයාලා පොඩ්ඩක් ඉන්න. |
| 我们要等多久？ | වෝමන් යො ඩන් ටො චියු?<br>අපි කොච්චර වෙලාවක් ඉන්න ඕනෙ ද? |
| 大概半个小时吧。 | ඩා ගැයි බන් ග ෂ්‍යා ෂීර් බා.<br>පැය භාගයක් පමණ. |

#### 对话　二　දෙවන සංවාදය

| | |
|---|---|
| 味道怎么样？ | වේ ටඕ සන් ම යන්?<br>රස කොහොම ද? |
| 真的很好吃。 | චැන් ද හන් හඕ චීර්.<br>ඇත්තටම හුඟක් රහයි. |

#### 对话　三　තෙවන සංවාදය

| | |
|---|---|
| 还要点什么？ | හැයි යො ඩීන් ෂන් ම?<br>තව මොනවාද අවශ්‍ය? |
| 谢谢。我吃饱了。这里的菜真的很好吃。 | ෂියැ ෂියැ. වෝ චීර් බෝ ල<br>චර් ලි ද සයි චැන් ද හන් හඕ චීර්.<br>ස්තුතියි. මගේ බඩ පිරිලා. මෙහි ව්‍යංජන රහයි. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

තේ සහ කෝපි කියන්නේ චීන මිනිස්සු පෙරදිගත් අපරදිගත් අතර සංස්කෘතික වෙනස හැඳින්වීමට බොහොම බහුලව යොදපු යෙදුමක්. වසර දහස් ගණනක් තිස්සේ තේ කියන්නේ චීනයේ වෙනස් නොවූ පානයක්. චීනයේ තේ බිහි වුණේ දළ වශයෙන් වසර පන් දහසකටත් එපිටදීයි. තේ සැබවින්ම පෙරදිගත් කෝපි බටහිරත් නියෝජනය කරනවා.

චීනේ දකුණු සහ නැගෙනහිර ප්‍රදේශයේ උෂ්ණත්වය තේ වගාවට ඉතාමත් යෝග්‍යයි. අතීතයේදී තේ ආසියාවේ සහ යුරෝපයේ රටවලට පැරණි සේද මාවත ඔස්සේ වෙළඳාමේ රැගෙන ගොස් තිබෙනවා. වර්තමානයේදී ලෝකයේ සෑම භාෂාවකින්ම පාහේ තේ හඳුන්වන්නේ චීන බසින් ඊට කියන ‘චා’ ශබ්දයට සමානව කියලා ඔබ දන්නවා ද?

කෝපි නිෂ්පාදනය කරන ප්‍රකට රටවලට සාපේක්ෂව චීනයේ කෝපි නිෂ්පාදනය එතරම් විශේෂ නැහැ. චීනේ ප්‍රථම කෝපි කර්මාන්ත ශාලාව වසර 1935 ශැංහයි නගරේ පිහිටවූවත් නවසිය අසූව දශකයේ මැද භාගයේ ක්ෂණික කුඩා කෝපි පැකට් වෙළඳ පොලට හඳුන්වා දෙන තුරුම චීන මිනිස්සු කෝපි රස පිළිබඳ ඉහළ උනන්දුවක් දැක්වූයේ නැහැ තේ වලට වගේ.



# චීන බිත්තර රොටි

ඉදිරිපත් කිරීම : වං යිං

## අවශ්‍ය ද්‍රව්‍ය

- හාල් පිටි ග්‍රෑම් 200ක්
- බිත්තර 4ක්
- ඇල් ජලය මිලිලීටර් 100ක්
- වට්ටක්කා ග්‍රෑම් 50ක්
- නිවිති කොළ කිහිපයක්
- ලූණු ග්‍රෑම් 5ක්
- සුදු ගම් මිරිස් කුඩු ග්‍රෑම් 5ක්
- තෙල් ස්වල්පයක්
- තල තෙල් තේ හැන්දක ප්‍රමාණයක්
- 4ක් හදා ගැනීමට හැකියි.

## සාදන ක්‍රමය

- නිවිති හා වට්ටක්කා ඉතා සුළු කැබලිවලට කපා ගන්න.
- බිත්තර, ඇල් වතුර හා හාල් පිටි එක් කර හොඳින් මිශ්‍ර කරන්න.
- කලින් කපා ගත් වට්ටක්කා කැබලි හා නිවිති කැබලි ඒ මිශ්‍රණයට දමන්න. ඊට අමතරව ලූණු, සුදු ගම් මිරිස් කුඩු හා තල තෙල් දාමා යළිත් හොඳින් මිශ්‍ර කර ගන්න.
- තැටියක් ගෙන එයට තෙල් ස්වල්පයක් යොදා එයට ඉහත මිශ්‍රණය දමා එය තැටිය මත පැතිර යන ලෙස සෙමින් කරකවන්න. මද ගින්නේ තබන්න.
- එක් පැත්තක් හොඳින් තැම්බුණු පසු එය අනිත් පස හරවා නැවත රත් කරන්න.
- මේ ආකාරයෙන් බිත්තර රොටි 4ක් හදා ගැනීමට හැකියි.





ඉදිරිපත් කිරීම : වං යිං







# බඩ අඩු කළ හැකි පානයක්

ඉදිරිපත් කිරීම : ශී යුයැ

නිවසේදීම සාදා ගත හැකි පානයක් දිනකට කෝප්ප දෙකක් පානය කර බඩ අඩු කර ගන්න වේගවත් සහ සාර්ථක ක්‍රමයක් තිබෙනවා.

අපි කාගේත් බඩ පොඩ්ඩක් හරි මහත වැඩියි. බඩ ප්‍රදේශය මහත් වුනාම ඔයාලා අකමැති පෙනුමක් ලැබෙනවා. මෙය සෞඛ්‍ය වශයෙන් ඉතාමත් අනතුරුදායක දෙයක් ද වෙන්න පුළුවන්. මේ මඟින් දියවැඩියාව, හෘද රෝග, ඉන්සියුලින් ප්‍රතිරෝදී බව, සමහර පිළිකා, රුධිර පීඩනය වැනි රෝග ඇති කරගන්න පුළුවන්.

බඩේ මේදය ඇති වීමට ඔබගේ වයස ඔබගේ ස්වාභාවය හා ඔබ ජීවත් වන ආකාරය වැනි දෑ බලපානවා. ඔබට ඔබගේ බඩේ මහත අඩු කර ගන්න ඕනේ නම් කරන්න තියෙන්නේ පොඩි දේවල් කිහිපයක් වැඩි දියුණු කරන එක විතරයි.

ව්‍යායාම සතියකට දින පහකට නොඅඩුව උදරය සඳහා කරන ව්‍යායාම සිදු කරන්න.

ආහාර පාලනය ඔබේ බර අඩු වන විට උදරයේ මහතත් අඩු වෙලා යනවා.

පීඩනයට පත් නොවී අවශ්‍ය විවේකය ලබා ගන්න. ඔබට මේ සියල්ලම සිදු කරලත් බඩ අඩු කරගන්න බැරි වුනාට කණගාටු වෙන්න වුවමනාවක් නෑ.

බඩ අඩු කරගන්න නිවසේදීම සකසා ගන්න පුළුවන් අපූරු බෙහෙත් වට්ටෝරුවක් සාදා ගන්නා ක්‍රමයක් තියෙනවා. ඔබට මෙම පානය සකසා ගැනීමට අවශ්‍ය වන දේ

ජලය කෝප්ප හතරක්, ඉගුරු පෙත්තක්, දෙහි ගෙඩියක්, මී පැණි මේස හැන්දක්

සාදාගන්නා ආකාරය

පළමුව ජලය තුලට ඉගුරු දමා බුබුළු දමන තුරු විනාඩි දහයක් රත්කර බා ගැනීමෙන් පසුව ඔබට දෙහි යුෂ එක්කර ගන්න පුළුවන්. ඉන් පසුව එය අඹරා ගෙන මී පැණි එකතු කර ගන්න. මෙම පානයෙන් කෝප්පයක් උදෑසනම පානය කරන්න. ඉතා විශිෂ්ඨ ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා දිනකට මෙයින් කෝප්ප දෙකක් හෝ තුනක් පානය කරන්න.



# අසල්වැසියන්ගේ බිත්ති පුවරුව

ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං









I Love My China



T.U. Epitawela



ශ්‍රී ලංකාව + චීනය

Sri lanka + ChiNa



Season's Greetings
And Best Wishes
For a Happy and Prosperous
New Year

උදාවන නව වසරට

# හත්වන පාඩම

# දියේ ගිලීමකදී ප්‍රථමාධාර




දියේ ගිලීම් අද අප රටේ බහුල ලෙස ජීවිත බිලිගන්නා අනතුරක් බවට පත්ව තිබෙනවා. දිනකට වටිනා ජීවිත 04 ක් තරම් බිලි ගැනීමට තරම් එය අදවන විට ප්‍රබලයි. ශ්‍රී ලංකාවේ වසරකට 1200ක් පමණ ජීවිත අහිමි කරන හා ඊටත් වඩා පිරිසක් දියේ ගිලීමට ආසන්න අවස්ථාවලින් වාසනාවට මෙන් බේරෙන මෙම අනතුර ලොව අනතුරුවලින් දෙවෙනි වන්නේ රිය අනතුරුවලට පමණක් බව ද ගණනය කොට තිබෙනවා.

දියේ ගිලීම්වලට ලක්වීමට බොහෝ විට බලපාන්නේ එවැනි අනතුරකින් බේරීමට පෙර සූදානමක් නොමැතිකම බව පැහැදිලි කරුණක්. විශේෂයෙන් කුඩා ළමුන් දියේ ගිලීම්වලට ලක්වන තත්වය බහුලයි. ජීවිතාරක්ෂකයින් නොමැති අවස්ථාවල ගංගා, වැව් හා නාන තටාක වැනි ස්ථානවල දිය නෑම, පිහිනීමට පුරුදු පුහුණු වී නොසිටීම, ජීවිතාරක්ෂක ජැකට් හෝ පිහිනුම් හා පාවෙන උපකරණ රහිතව දිය නෑමට පෙළඹීම, අවදානම් ස්ථාන යැයි නම් කොට ඇති ස්ථානවලට බැසීම, ආගන්තුක ස්ථානවල සෝදිසියකින් තොරව දිය නෑමට හා පිහිනීමට යාම, කුඩා ළමුන් හා ළදරුවන් වැඩිහිටියන්ගේ අවධානයෙන් බැහැරව ජලය වෙත ළඟා වීම, මීමැස්මොර හෙවත් අපස්මාර රෝගීන් තනිවම ජලයේ සිටීම, පුහුණුවකින් හෝ උපදේශනයකින් තොරව ජල ක්‍රීඩා සිදු කිරීම වැනි සාධක බොහොමයක් දියේ ගිලීම්වලට හේතු වී තිබෙනවා. එවැනි දියේ ගිලීම්වලට ලක් වීමෙන් තොරව ආරක්ෂිතව ජලය භාවිතා කිරීමට නම් ඊට මනා දැනුමක් හා පෙරසූදානමක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා ජීවිතාරක්ෂකයින් ළඟ සිටින වැව්, ගංගා, නාන තටාක වැනි ස්ථානවල දිය නෑමට හෝ පිහිනීමට යාම, පිහිනීමට පුරුදු වීම, ජලයේදී ජීවිතාරක්ෂක උපකරණ පැළඳ සිටීම, වැඩිහිටි අවධානයකින් තොරව කුඩා දරුවන් හෝ ළදරුවන් ජලය වෙත යොමු නොකිරීමට වග බලා ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතයෙන් හෝ ආහාරගත් විගසම ජලයට බැසීමෙන් වැළකී සිටීම, මීමැස්මොර රෝගීන් වෙනත් අයෙකු ළඟ සිටින විට පමණක් ජලය භාවිතා කිරීම, ගංවතුර තත්වයන්වලදී ජලක්‍රීඩා කිරීමෙන් වැළකීම, ඔරු බෝට්ටු ආදිය පැදීමේදී ජීවිතාරක්ෂක උපකරණ පැළඳීම, ආගන්තුක ස්ථානවල අපරීක්ෂාකාරීව දියට බැසීම හෝ පැනීම නොකිරීම ඉතාම වැදගත් වෙනවා.

කෙසේ වුවද කිසියම් හෝ හේතුවක් නිසා යමෙකු දියේ ගිලීමකට ලක්වුවහොත් පහත සඳහන් පියවර අනුගමනය කිරීමෙන් ඔවුන්ව බේරා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.






## 01. Rescue - ආරක්ෂිතව මුදවා ගන්න

ඔබ හා අවට සිටින්නන් ආරක්ෂා වී ආධාරක භාවිතයෙන් අනතුරට පත් වූ පුද්ගලයා ගොඩබිමට ගන්න. ගිලුණු පුද්ගලයාව බේරා ගැනීමට සෑම විටම දියට පැනීම අවශ්‍ය නැහැ. ඔබට ජීවිතාරක්ෂක පුහුණුවක් නොමැති නම් හෝ මැනවින් පිහිනීමට නොදන්නේ නම් දියට පැනීමෙන් වළකින්න. ඒ සඳහා සුදුසුකම්ලත් අය අවට සිටී නම් උදව් ඉල්ලා ගන්න. ලී දඬුවක්, ලණු, කඹ, පොල් අතු, ජීවිතාරක්ෂක පාවෙන උපකරණ ආදිය අවට තිබේනම් පුද්ගලයා වෙත යොමු කොට අල්ලා ගැනීමට උපදෙස් දී ගොඩබිමට ඇද ගැනීමට උත්සාහ ගන්න. දියේ ගිලෙමින් සිටින විටදී වඩාත් යෝග්‍ය වන්නේ හැකිතාක් දැඟලීමෙන් තම ශක්තිය හා සිරුරේ ඇති ඔක්ෂිජන් වැය කරවා දියේ ගිලීම ඉක්මන් කරගන්නවාට වඩා අඩුම තරමේ දිය මත පාවෙමින් සිටීමට උත්සාහ දැරීමයි.





## 02. Assess - තක්සේරු කරන්න

දියේ ගිළුණු පුද්ගලයා ජලයෙන් ඉවතට ගත් වහාම ඔහුගේ සිහිය, ස්වසන මාර්ගය හා ස්වසනය, රුධිර සංසරණය පරීක්ෂා කොට රෝගී තත්ත්වය අවබෝධ කර ගන්න. ඒ සඳහා පහත පියවර අනුගමනය කරන්න.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
|  |  |  |  |
| පුද්ගලයාට කතා කරන්න. උරහිසට තට්ටු කොට ප්‍රතිචාර දක්වන්නේදැයි බලන්න. ප්‍රතිචාර නොදක්වන්නේ නම් ඉක්මනින් ඉදිරි පියවර අනුගමනය කරන්න. | නළලට එක් අතක් සහ නිකට මතට ඇඟිලි 02ක් තබා හිස පිටුපසට නැඹුරු කරන්න. මුඛයේ කිසියම් දෙයක් සිරවී ඇත්නම් ඉවත් කරන්න. | පුද්ගලයා ස්වසනය කරයිදැයි පරීක්ෂා කරන්න. පුද්ගලයාගේ ස්වසන ශබ්දය ඇසීම, ස්වසන වායුව ඔබගේ කම්මුලට දැනීම හා පපුව උස්පහත් වනවා දැයි බැලීම මගින් මෙය කළ හැක. | රුධිර සංසරණය (නාඩි) සිදුවනවාදැයි පරීක්ෂා කර බලන්න. පුද්ගලයා හුස්ම නොගනී නම් හෝ නාඩි දක්නට නොලැබේ නම් ඉතා ඉක්මනින් ප්‍රථමාධාර ලබා දීම අරඹන්න. |

## 03. First Aid - ප්‍රථමාධාර ලබා දෙන්න

| ප්‍රතිචාර දක්වයි නම් (සිහිය තිබේනම්) | අසිහි නමුත් ස්වසනය කරයි නම් | ස්වසනය නොකරයි නම් |
|---|---|---|
| ■ මුඛයේ විවිධ දේ සිරවී ඇත්නම් ඉවත් කරන්න.  ■ තෙත ඇඳුම් මාරු කරවා වියළි ස්ථානයක ආරක්ෂිත ඉරියව්වේ තබන්න.  ■ වෙනත් ආබාධ තිබේනම් රෝහල්ගත කරන්න. | ■ මුඛයේ විවිධ දේ සිරවී ඇත්නම් ඉවත් කරන්න.  ■ ආරක්ෂිත ඉරියව්වේ තබන්න.  ■ වියළි ඇඳුම් අන්ද-වන්න. හොඳින් පොරවන්න. ■ රෝහල්ගත කරන්න. | 1. Call an Ambulance - ගිලන් රථයකට අමතන්න.  2. Rescue Breaths - කෘතිම ස්වසනය කෘතිම ස්වසන වාර 05 ක් ලබා දෙන්න.  3. Chest Compressions - පපු පීඩනය පපු පීඩන වාර 30 ක් ලබා දෙන්න. 4. Rescue Breaths - කෘතිම ස්වසනය නැවතත් කෘතිම ස්වසන වාර 02 ක් ලබා දෙන්න. 5. Continue 30:02 - CPR පවත්වාගෙන යාම අනතුරුව පුද්ගලයාගේ ස්වසනය ප්‍රතිස්ථාපිත වනතෙක් හෝ රෝහල වෙත භාර දෙන තෙක් 30෴02 අනුපාතය යටතේ කෘතිම පපු පීඩනය හා කෘතිම ස්වසනය ලබාදෙමින් ඉක්මනින්ම රෝහල්ගත කරන්න.   |

ඉහත ප්‍රථමාධාර ක්‍රමශිල්ප එදිනෙදා ප්‍රායෝගිකව භාවිතා කිරීම සඳහා විධිමත් ප්‍රථමාධාර පුහුණුවකට සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර මෙම තොරතුරු කියවීම පමණක් ප්‍රථමාධාර ලබාදීමට ප්‍රමාණවත් හැකියාවක්, දැනුමක් හා විශ්වාසයක් ලබා නොදෙයි. ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රම ශිල්ප පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක. ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතා කරන්න 0115347000.



# ශ්‍රී ලංකා රතුකුරුස සමාජය

# ගොවීන් සමග වී වගා අත්හදා බැලීමක්

ශ්‍රී ලංකාවේ වගා කරන භූමි ප්‍රමාණයෙන් 34% පමණ වී වගාවට උපයෝගී කර ගනී. දැනට ගොවීන් බහුතරය වගා කරනු ලබන්නේ වැඩි අස්වැන්නක් ලබා දෙන වී වර්ග වේ. මෙම වැඩි අස්වැන්න ලබාදෙන වී වර්ග සඳහා වැඩි පෝෂ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණයක් අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ වී වගා කරන පසෙහි කාබනික ද්‍රව්‍ය සහ පොෂ්‍ය ද්‍රව්‍ය අඩුකම නිසා ඒවා බාහිරින් සැපයීමට සිදුවේ. ඒ නිසා ගොවීන් කෘෂි රසායනික භාවිතයට පෙළඹී ඇති අතර ඒවායින් බොහෝ ප්‍රමාණයක් අපතේ යයි. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයෙන් ප්‍රධාන ගැටලුවක් ලෙස නිෂ්පාදන වියදම අධිකවීම හඳුනගෙන ඇත. මේ සියල්ල සලකාබලා ශ්‍රී ලංකා වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය අඩු වියදම් වගා ක්‍රමයක් ලෙස "පැරචූට්" වගා ක්‍රමය හඳුන්වා දී ඇත. මෙම ක්‍රමයෙන් බීජ වී සඳහා යන වියදම 75% පමණ අඩු කර ගත හැකි අතර අස්වනු ප්‍රමාණයද 20% පමණ වැඩි කර ගත හැකිය. එසේම අඩු ජල අවශ්‍යතාවකින් වගා කල හැකි වීම, පලිබෝධ හානි වලට ඔරොත්තු දීම, වල් මර්ධනය සඳහා යන වියදම අඩු වීම ද තවත් වාසී ලෙස හඳුනා දිය හැකිය.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මෙම ක්‍රමය ගොවීන් අතර ප්‍රචලිත කිරිම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් සමග මහත් වෑයමක යෙදී සිටි.

මෙම විශේෂ ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්මන කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස දැනට සිදුකරනු ලබයි.



"පැරචූට්" ක්‍රමයට තවාන් දමන තැටිය



වගාවට පෙර

සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමානයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ........................................

ලිපිනය : ........................................

වයස : .................... පාසල : ....................

දුරකථන : .................... විද්‍යුත් ලිපිනය : ....................

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ........................................

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774

# සුභාසර පාඨක සාමාජිකයෝ



සාමාජික අං : 51
**පෙහෙවි ද සිල්වා**
ගේට්වේ ජාත්‍යන්තර පාසල
කොළඹ



සාමාජික අං : 52
**ගමික අන්සල**
මාර/මාතර මධ්‍ය මහා විද්‍යාලය
මාතර



සාමාජික අං : 53
**තරංගනී ලක්මාලි**
මහනුවර උසස් බාලිකා විදුහල
මහනුවර



සාමාජික අං : 54
**නයනි කෞශල්‍යා**
ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය
පොල්ගොල්ල



සාමාජික අං : 55
**දුලන කවීශ්**
කෑගලු විද්‍යාලය
කෑගල්ල



සාමාජික අං : 56
**කවිඳු ෂෙහාන්**
රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය
හංවැල්ල



සාමාජික අං : 57
**විදුන් මාලිත**
ආනන්ද විද්‍යාලය
කොළඹ



සාමාජික අං : 58
**දුලක්ෂි සෙව්මිනි**
ක/ශාන්ත ජෝන් විද්‍යාලය
කළුතර



සාමාජික අං : 59
**සුපුන් පියුමාල්**
රජයේ බෞද්ධ විද්‍යාලය
රත්නපුර



සාමාජික අං : 60
**මහීමා හංසනි**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 61
**තරුෂි හිමායා**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 62
**නිමංගි නෙත්සිළුණි**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 63
**කාවින්දි දීපශිකා**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 64
**මහේෂි විජේසේකර**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 65
**මෙලීෂා සෙව්මිණි**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 66
**රිසිනි විහංසා**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 67
**තරුෂි පමෝදි**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 68
**ගයානා නර්මදි**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 69
**පෙත්මි සිත්හාරා**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ



සාමාජික අං : 70
**එෂානි නෙත්මිණි**
ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
මාලඹේ






| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 7260/9490/7265/11900 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ට්න් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL


**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2373/0439
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka